# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,818 - 2013 ජූලි මස 05 වැනි සිකුරාදා - 2013.07.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : I වැනි ඡේදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 586 |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | –– |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... ... | 587 |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | — |
| රජයේ නිවේදන ... ... ... | 591 |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 597 |
| නැවියන්ට දැන්වීම් ... ... ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... | — |


*සැ. යු.-* (i) ගල්හින්න ජාමිඅතුල් ෆක්තාහ් අරාබි විදුහල (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත, 2013 මැයි මස 10 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II* වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී ;

(ii) ගබඩා ව්‍යාපෘති (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත, 2013 මැයි මස 10 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II* වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී ;

(iii) සෙරෙට්සෙ බාමා පදනම් භාරය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත, 2013 මැයි මස 10 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II* වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳ ව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳ ව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳ ව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට මෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2013 ජූලි මස 26 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2013 ජූලි මස 12 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති (*වැ. බ.*).

2013 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

2013 අංක 223

D/AF/8/2.

**ශ්‍රී ලංකා ගුවන් හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද උසස් කිරීම්

පහත නම සඳහන් නිලධාරියා ඔහුගේ නමට ඉදිරියෙන් දක්වා ඇති දින සිට ස්ථිර එයාර් කොමදෝරු නිලයට උසස් කෙරේ.

තාවකාලික එයාර් කොමදෝරු අනිල් පුෂ්ප ශාන්ත නරසිංහ (01387) පරිපාලන - 2011.05.21

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය.

2011 ජුනි මස 10 වැනි දින,
කොළඹ දී ය.

07-109/2

---

2013 අංක 224

D/AF/8/2.

**ශ්‍රී ලංකා ගුවන් හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද උසස් කිරීම්

පහත නම සඳහන් නිලධාරියා ඔහුගේ නමට ඉදිරියෙන් දක්වා ඇති දින සිට ස්ථිර එයාර් කොමදෝරු නිලයට උසස් කෙරේ.

ගෲප් කැප්ටන් ජෝන් සංජක ඉරේෂාන් විජේමාන්න (01392) පරිපාලන - 2011.06.01

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය.

2011 ජුනි මස 10 වැනි දින,
කොළඹ දී ය.

07-109/1

---

2013 අංක 225

D/AF/8/2/T.

**ශ්‍රී ලංකා ගුවන් හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද උසස් කිරීම්

පහත නම සඳහන් නිලධාරියා ඔහුගේ නමට ඉදිරියෙන් දක්වා ඇති දින සිට තාවකාලික එයාර් කොමදෝරු නිලයට උසස් කෙරේ.

ගෲප් කැප්ටන් විතාරනගේ ලේනාර්ඩ් රාජ් ප්‍රියන්ත රුද්‍රිගු (01443) පරි/රේජි - 2011.06.30

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය.

2011 පෙබරවාරි මස 13 වැනි දින,
කොළඹ දී ය.

07-110

---

2013 අංක 226

D/AF/715.

**ශ්‍රී ලංකා ගුවන් හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

2010 ජනවාරි මස 01 වැනි දින සිට පහත නම සඳහන් නිලධාරියා ශ්‍රී ලංකා ගුවන් හමුදාවෙන් විශ්‍රාම ගන්නවා ඇත.

විංග් කොමාන්ඩර් නන්ඳදිරි දේවගේ ජනත් රණවීර (01484) - පාලන

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2009 අගෝස්තු මස 10 වැනි දින,
කොළඹ දී ය.

07-23

2013 අංක 227

D/AF/731.

**ශ්‍රී ලංකා ගුවන් හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

2010 මැයි මස 31 වැනි දින සිට පහත නම සඳහන් නිලධාරියා ශ්‍රී ලංකා ගුවන් හමුදාවෙන් විශ්‍රාම ගන්නවා ඇත.

ස්කොඩ්රන් ලීඩර් තෙලිගෙදර සිදත් ශ්‍රී සුභාෂණ පෙරේරා (01678) - කාර්මික/ඉංජිනේරු

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2009 සැප්තැම්බර් මස 24 වැනි දින,
කොළඹ දී ය.

07-22

# වෙනත් පත්කිරීම් ආදිය

2013 අංක 228

*ගැසට් නිවේදනයයි*

1978 අංක 02 දරන අධිකරණ සංවිධාන පනතේ 45(2) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර අධිකරණ අමාත්‍ය, රවුෆ් හකීම් වන මම,

1. විජයරත්නම් විජයසාන්තන් මහතා, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
2. මොහම්මඩ් ඉබ්‍රාහිම් සලීම් මහතා, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
3. හබීබ් මොහමඩ් මක්කීන් මහතා, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
4. වන්නි ආරච්චි කංකානම්ගේ ජිනදාස චන්ද්‍රලාල් මහතා, ගාල්ල අධිකරණ කලාපය සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
5. සින්නයියා ගෝවින්දසාමි සිවයෝගනාදන් මහතා, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
6. අඹගස්පිටියේ ගෙදර චමින්ද රංගජීව මහතා, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
7. අබ්දුල් කාදර් මොහමඩ් ෆලීල් මහතා, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
8. කන්දේවත්තේ රාලලාගේ රාහුල ධම්මික බණ්ඩාර කන්දේවත්ත මහතා, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
9. ගල්ගොඩ හේනේගේ හර්ෂ රුවන් කෝකිල ආරියදාස මහතා, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
10. අලියාර් ලෙබ්බේ ජවුෆර් සාදික් මහතා, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
11. මොහමඩ් ඉක්බාල් මහතා, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
12. ගාමිණී සෙන්දනායක මහතා, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
13. සේගු අක්බර් සහබ්දීන් මහතා, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
14. විජේසිංහ මුදියන්සේලාගේ ප්‍රියන්ත විජේසිංහ මහතා, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
15. මීරිහාගොඩ මුදියන්සේලාගේ සමන්තා කුමාරි කරුණාරත්න මහත්මිය, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරියක වශයෙන්ද,
16. මොහම්මදු යූසුෆ් උම්මුල් මහිරිෆා මහත්මිය, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
17. නවරත්න මුදියන්සේලාගේ පද්මකුමාර නවරත්න මහතා, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
18. ගම්ලත් කංකානමලාගේ චන්ද්‍රදාස පෙරේරා මහතා, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
19. සුක්රියා කාරියප්පර් මෙනෙවිය, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරියක වශයෙන්ද,
20. ධර්මකුලසිංගම් ජුගදීස්වරා මහතා, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
21. නඩනසපාපදි ප්‍රදීප්කුමාර් මහතා, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
22. යාසීන් බාවා අෂ්රෆ් මහතා, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
23. මදප්පුලි ආරච්චිගේ බුද්ධදාස ප්‍රනාන්දු මහතා, පානදුර අධිකරණ කලාපය සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
24. කාරියකරවන පටබැදි මහාවිදානෙලාගේ මෙරිල් රංජන් ප්‍රදිනාන්දු මහතා, පානදුර අධිකරණ කලාපය සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,

25. අබ්දුල් කරීම් මුහම්මඩ් මහතා, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
26. සිංගරායර් වසීකරන් මහතා, යාපනය අධිකරණ කලාපය සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
27. අම්ර්දලිංගම් අගන් මහතා, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
28. අබ්දුල් රසූල් මුහම්මදු ජෙමීල් මහතා, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
29. කහපොල ආරච්චිගේ පෙම්සිරි ඉන්ද්‍රජිත් මහතා, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
30. මුතුමුණි ප්‍රේමසිරි මහතා, මීගමුව අධිකරණ කලාපය සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
31. ආදම් බාවා ජෙලීල් මහතා, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
32. ආරුමුගම් වඩිවළකන් මහතා, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
33. ඉමියාහාමි මුදියන්සෙලාගේ සෝමපාල මහතා, හලාවත අධිකරණ කලාපය සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
34. අබ්දුල් කරීම් හස්සාන් මහතා, යාපනය අධිකරණ කලාපය සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
35. පූජ්‍ය කවුඩාගම්මන විමලරතන ස්වාමින්වහන්සේ, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
36. වලිසුන්දර මුදියාන්සේලාගේ රන්බණ්ඩා වලිසුන්දර මහතා, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
37. මීරා සාහිබ් මොහමඩ් ජලීල් මහතා, යාපනය අධිකරණ කලාපය සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
38. මුල්ලගේ දොන් හේරත් විනීතරත්න මහතා, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
39. දොන් අනිල් දේශප්‍රිය වානගුරු මහතා, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
40. තමීම් මොහමඩ් රුෂාන් මහතා, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
41. නඩරාජා කේතීස්වරන් මහතා, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
42. ස්වාමිනාදන් සර්වානන්දන් මහතා, යාපනය අධිකරණ කලාපය සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
43. අබ්දුල් ෂකූර් අහමඩ් රුෂ්දි මහතා, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
44. දිසානායක මුදියන්සේලාගේ චින්තක නිශාන්තප්‍රිය බණ්ඩාර මහතා, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
45. ජයසිං මානච්චිගේ සෝමලාල් මහතා, හම්බන්තොට අධිකරණ කලාපය සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
46. මොහමඩ් අලි මොහමඩ් කාලිඩ් මහතා, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
47. සිවසුබ්‍රමනියම් නාගම්මා මහත්මිය, යාපනය අධිකරණ කලාපය සඳහා සාමදාන විනිශ්චයකාරවරියක වශයෙන්ද,
48. පොන්රාමන් දේවනේසන් මහතා, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
49. මොහම්මදු ඉස්මායිල් අබ්දුල් රහ්මන් මහතා, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
50. රාජනෙත්ති දේවගේ නිමල් ප්‍රේමසිරි මහතා, මීගමුව අධිකරණ කලාපය සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
51. පූජ්‍ය සිරිමල්ගොඩ විමලජෝති ස්වාමින්වහන්සේ, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
52. අහමඩ් ඉස්මායිල් මොහමඩ් නිලාම් මහතා, කළුතර අධිකරණ කලාපය සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
53. මෙරෑන්ඤගේ ශ්‍රීමති ප්‍රනාන්දු මහත්මිය, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරියක වශයෙන්ද,
54. හෙට්ටිආරච්චිගේ උපාලි පීරිස් මහතා, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
55. මොහොමඩ් සනූන් මොහොමඩ් ෆිර්දවුස් මහතා, කළුතර අධිකරණ කලාපය සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
56. වීරකෝන් මුදියන්සේලාගේ සන්ධ්‍යා කුමාරි වීරකෝන් මහත්මිය, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරියක වශයෙන්ද,
57. මලයාන්ඩි ජෙයප්‍රකාස් මහතා, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
58. අහමඩ් ලෙබ්බේ අබ්දුල් ලතීෆ් මහතා, කල්මුණේ අධිකරණ කලාපය සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
59. පතිරගේ දොන් ජයතිලක පෙරේරා මහතා, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
60. මිර්සා තුන්කු ඔස්මාන්ඩ් මහතා, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
61. තුවාන් රිස්වාන් බදුරුඩීන් මහතා, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
62. ගලගමඅච්චිගේ දොන් උපාලි ජයවර්ධන මහතා, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
63. සුනිල් විරිතමුල්ල ගමගේ මහතා, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
64. දීප්තිකා හෙලන් බස්නායක මහත්මිය, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරියක වශයෙන්ද,
65. කදිරජ්ජා ගොඩගේ සරත් පැරකුම් විජයරත්න මහතා, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
66. මුහම්මදු කාසිම් මුහම්මදු කමරුල් මුනීර් මහතා, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
67. ජයරත්නගේ සුනිල් ශාන්ත මහතා, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
68. මුහම්මදු කාසින් මුහම්මදු අන්සාර් මහතා, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
69. මුහම්මඩ් සියාඩ් මුහම්මඩ් ශයීම් අන්ෆාස් මහතා, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
70. ගෝනියා මාලිම්ගේ උදේනි දිල්රුක්ෂි අපෝන්සු මෙනවිය, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරියක වශයෙන්ද,
71. කස්තුරිආරච්චිගේ සිරිපාල මහතා, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
72. රත්නායක මුදියන්සේලාගේ සුනිල් බණ්ඩාරනායක මහතා, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
73. අලුත් දූරගේ විමලසුන්දර මහතා, කොළඹ අධිකරණ කලාපය සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
74. නාගුර්තම්බි නසුමුදීන් මහතා, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
75. වික්‍රමසිංහ මුදියන්සේලාගේ සෙනෙවිරත්න බණ්ඩා මහතා, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
76. කරාගොඩ ලොකු ගමගේ උදයානන්ද මහතා, කොළඹ අධිකරණ කලාපය සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
77. පිටිගල ලියනගේ චන්ද්‍රසිරි මහතා, කොළඹ අධිකරණ කලාපය සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
78. සෝමසුන්දරම් රවීන්ද්‍රරාජා මහතා, කල්මුණේ අධිකරණ කලාපය සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
79. උදුමාලෙබ්බේ නසාර් මහතා, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
80. තංගරාසා ධර්මරත්තිනම් මහතා, කල්මුණේ අධිකරණ කලාපය සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
81. සෙනරත්ගේ ආනන්ද විජේතිලක මහතා, පානදුර අධිකරණ කලාපය සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
82. අබ්දුල් මජීඩ් සිත්ති කයිරුන් නිශා මහත්මිය, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරියක වශයෙන්ද,

83. ගොඩිගමුව එදිරිසිංහ පතිරාජගේ තිළිණ ප්‍රියන්ජිත් එදිරිසිංහ මහතා, අම්පාර අධිකරණ කලාපය සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
84. සුනන්ද චන්ද්‍ර විදානගේ මහතා, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
85. ඉබ්‍රාලෙබ්බේ මුහමද් උවයිස් මහතා, කල්මුණේ අධිකරණ කලාපය සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
86. කුලසිංහගේ මුදිත් නලින්ත මහතා, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
87. අබ්දුල් රහීම් මොහමඩ් සාලිහ් මහතා, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
88. මුහම්මදු සාදික් මුනීර් මුහම්මදු මහතා, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
89. කරුණාදාස ගාල්ලගේ මහතා, ගාල්ල අධිකරණ කලාපය සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
90. සෝමසුන්දරම් නගුලේස්වරම්පිල්ලේ මහතා, වවුනියාව අධිකරණ කලාපය සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
91. මොහමඩ් අබ්දුල් කරීම් මොහමඩ් රයීස් මහතා, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
92. අබූබකර් පකීර් මොහිදීන් ෆලීල් මහතා, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
93. ඉන්දික දුමිඳු අමරසේකර මහතා, බලපිටිය අධිකරණ කලාපය සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
94. නල්ලතම්බි තංගවඩිවෙල් මහතා, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
95. මොහමඩ් හරූන් මොහමඩ් රාෆික් මහතා, මඩකලපුව අධිකරණ කලාපය සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
96. නාඹටුන්නෙ පල්ලිය ගුරුගේ මානි මාලා මහත්මිය, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරියක වශයෙන්ද,
97. නාඹටුන්න පල්ලිය ගුරුගේ මාධව දුමින්ද වික්‍රමසිංහ මහතා, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
98. මොහමඩ් ඉෂාක් මොහමඩ් සමීම් මහතා, ත්‍රිකුණාමලය අධිකරණ කලාපය සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
99. රාජේන්ද්‍ර වික්‍රමනායක කරුණාරත්න මහතා, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
100. හල්ලල හොඳගේ ප්‍රේමවතී (ප්‍රේමා හොඳගේ) මහත්මිය, මාතර අධිකරණ කලාපය සඳහා සාමදාන විනිශ්චයකාරවරියක වශයෙන්ද,
101. පකීර් මොහිදීන් මොහොමඩ් ජලීල් මහතා, කල්මුණේ අධිකරණ කලාපය සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
102. අතුල කිත්සිරි ජයසිංහ මහතා, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
103. හේරත් ආරච්චිගේ ගාමිණී නිශ්ශංක මහතා, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
104. හබීබ් නානා මොහමඩ් පුවාදු මහතා, කෑගල්ල අධිකරණ කලාපය සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
105. ලෙව්දෙනි පතිරන්නැහැලාගේ ජසින්තා රූපස්සරගේ මහත්මිය, කුරුණෑගල අධිකරණ කලාපය සඳහා සාමදාන විනිශ්චයකාරවරියක වශයෙන්ද,
106. කාර්තිගේසු සිවකුමාර් මහතා, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
107. අහමඩ් ලෙබ්බේ මොහමඩ් නවාස් මහතා, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
108. විතානගමගේ ප්‍රසන්න සම්පත් විතානගමගේ මහතා, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
109. රෙක්ස් ඇන්ස්ලම් ජෝසප් පෙරේරා කහඳවල මහතා, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
110. ෆාතිමා සාහිදා මුස්නි ඩීන් මහත්මිය, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරියක වශයෙන්ද,
111. හවුපේ ලියනගේ සුධර්මා චන්ද්‍රකාන්ති මහත්මිය, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරියක වශයෙන්ද,
112. ලේකම්වසම් අමරසිරි ජගත් ප්‍රියන්ත ගුණවර්ධන මහතා, කොළඹ අධිකරණ කලාපය සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
113. සෙයිනුල් ආබ්දීන් මුහුතෆීර් මුහම්මඩ් මහතා, කල්මුණේ අධිකරණ කලාපය සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
114. වේලුපිල්ලේ කාරාලසිංගම් මහතා, මඩකලපුව අධිකරණ කලාපය සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
115. සරුකාර සෙනරත් පුෂ්ප කුමාර මහතා, ගම්පහ අධිකරණ කලාපය සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
116. ආදම් කණ්ඩු මොහමඩ් ජමාල්ඩීන් මහතා, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
117. කංකානම්ගෙදර බමුණුහෙන්දරලාගේ සුමේධ වසන්ත කුමාර මහතා, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
118. කන්දේගෙදර ආරච්චි චරිත වික්‍රමසිංහ මහතා, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
119. කාදර් මීරා සාහිබු මහබූබ් මහතා, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
120. නල්ලයියා ලෝගේස්වරන් මහතා, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
121. මොහමඩ්තම්බි මොහමඩ් නව්ෆල් මහතා, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
122. නවගමුවගේ මහර්සා සිතුමිණි පෙරේරා මෙනවිය, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරියක වශයෙන්ද,
123. හේවාරංගමගේ සුගතදාස මහතා, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
124. විජේතුංග මුදියන්සේලාගේ හීන්බණ්ඩා විජේතුංග මහතා, බදුල්ල අධිකරණ කලාපය සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
125. මොහමඩ් සුල්තාන් ෂමීල් මොහමඩ් මහතා, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
126. ගල් කඩුවගේ සුසන්තා ජයරත්න මහත්මිය, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරියක වශයෙන්ද,
127. කහවිදානගේ සිරිවර්ධන මහතා, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
128. මොහමඩ් කබීර් නිසාම්දීන් මහතා, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
129. සුජිත් සුමේධ වික්‍රමසේකර රාජපක්ෂ විමලගුණරත්න මහතා, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
130. තිලගරෙත්නම් දිනේෂ් මහතා, කල්මුණේ අධිකරණ කලාපය සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
131. ආදම්බාවා ලෙබ්බේ කලීල් මහතා, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
132. වීරසිංහ මීගහවත්තගේ රුවිනි සාගරිකා වීරසිංහ මහත්මිය, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරියක වශයෙන්ද,
133. අමරසිංහ ගමරාලලාගේ පියසිරි අමරසිංහ මහතා, ගම්පහ අධිකරණ කලාපය සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
134. ආදම්බාවා මොහමඩ් අබූබක්කර් මහතා, කුරුණෑගල අධිකරණ කලාපය සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
135. නඩරාජා යෝගරන්ජන් මහතා, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
136. කෙහෙල්හේනේගෙදර ජාලිය පියසේකර මහතා, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
137. මොහමඩ් අනස් රමලාන් අරූස් මහතා, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
138. වික්‍රමසූරිය පටබැඳිගේ අනිල් සරත් මහතා, කළුතර අධිකරණ කලාපය සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,

139. කළු ආරච්චිගේ ඉන්දික රෝෂාන් මහතා, මාතර අධිකරණ කලාපය සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
140. මොහමඩ් සාහිර් මොහමඩ් සෆ්රුල් අහමඩ් මහතා, කොළඹ අධිකරණ කලාපය සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
141. අතුරලිය බඩල්ගෙදර විකුම්සේන මහතා, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
142. සින්ගන්කුට්ටි ආරච්චිගේ ලලිතා පද්මසීලි මහත්මිය, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරියක වශයෙන්ද,
143. අබ්දුල් කාදර් සාහිරා මහත්මිය, කල්මුණේ අධිකරණ කලාපය සඳහා සාමදාන විනිශ්චයකාරවරියක වශයෙන්ද,
144. රාජපක්ෂ මුදියන්සේලාගේ නදිකා සෙව්වන්දි මහත්මිය, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරියක වශයෙන්ද,
145. සිංගන්කුට්ටි ආරච්චිල්ලාගේ වීරරත්න මහතා, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
146. රසාක් මොහමඩ් ෆාරිස් මහතා, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
147. මෙරෙඤ්ඤ සැන්ටස් ද සිල්වා ජයරත්න මහතා, බලපිටිය අධිකරණ කලාපය සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
148. ලක්මාල් චින්තක ඕපනායක මහතා, කළුතර අධිකරණ කලාපය සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
149. මොහොමඩ් නස්ලීම් මහතා, කුරුණෑගල අධිකරණ කලාපය සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
150. දසනායක මුදියන්සේලාගේ අජිත් ප්‍රියලාල් කරුණාරත්න මහතා, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
151. යක්මැඩිල්ලේ ලයනල් ප්‍රියන්ත රුවන් කරුණාතිලක මහතා, රත්නපුර අධිකරණ කලාපය සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
152. මුහම්මදු අබූබකර් ඩූර්රුන් ඩලීල් අබූබක්කර් මහතා, කල්මුණේ අධිකරණ කලාපය සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
153. දිවෙලිගොඩ ගමගේ සිරිපාල කුමාරසිංහ මහතා, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
154. සිවප්‍රගාසම් රාජකුලේන්ද්‍රන් මහතා, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
155. ඇල්ලේ කපුරාලලාගේ ධනපාල ගුණරත්න මහතා, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
156. ෂාහුල් හමීඩ් මොහමඩ් නලීෆ් මහතා, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
157. හේනක රාලලාගේ ප්‍රියන්ත සේනානායක මහතා, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
158. නැකැත් ගෙදර සමන් ප්‍රියදර්ශන රණසිංහ මහතා, පොළොන්නරුව අධිකරණ කලාපය සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
159. මනික්තුවාහන්දි පාලිත ද සිල්වා මහතා, ගාල්ල අධිකරණ කලාපය සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
160. කරවිට විදානලාගේ දෝන තනුජා හර්ෂිණී කරවිට මහත්මිය, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරියක වශයෙන්ද,
161. සිත්තිකීන් මුහම්මදු ඉරුසාත් මහතා, මඩකලපුව අධිකරණ කලාපය සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
162. පූජ්‍ය ගොඩිගමුවේ විමල දේව ස්වාමින්වහන්සේ, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
163. සේනානායක ආරච්චිගේ සරත් පුෂ්ප කුමාර මහතා, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
164. අහමඩ් ලෙබ්බේ මුහමඩ් ඉර්ෂාත් මහතා, කල්මුණේ අධිකරණ කලාපය සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
165. මාරසිංහ ආරච්චිගේ දීපිකා මාරසිංහ මහත්මිය, මීගමුව අධිකරණ කලාපය සඳහා සාමදාන විනිශ්චයකාරවරියක වශයෙන්ද,
166. අබේකෝන් මුදියන්සේලෑ විහාරේ ගෙදර උපතිස්ස බණ්ඩාර මහතා, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
167. ආදම් ලෙබ්බෙ අබ්දුල් මජීඩ් මහතා, කල්මුණේ අධිකරණ කලාපය සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
168. මේසසූරිය මුදියන්සේලාගේ ධම්මික සුදර්ශන මේසසූරිය මහතා, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
169. සමරකෝන් මුදියන්සේලාගේ සේනාරත්න මහතා, මහනුවර අධිකරණ කලාපය සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
170. මොහමඩ් මන්සූර් මොහමඩ් යහියකාන් මහතා, මඩකලපුව අධිකරණ කලාපය සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
171. හේවයලාගේ සුගත් චමින්ද වීරසිංහ මහතා, කෑගල්ල අධිකරණ කලාපය සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
172 විනයාගම් නිත්තියානන්දන් මහතා, කල්මුණේ අධිකරණ කලාපය සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
173. නාහුර් ඊබ්‍රහීම් අබුතාලිෆ් මහතා, පුත්තලම අධිකරණ කලාපය සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
174. දිසානායක පතිරණගේ අසේල සම්පත් ප්‍රේමරත්න මහතා, ගම්පහ අධිකරණ කලාපය සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
175. ඕෂදී චිංතානි කෞශල්‍යා අබේකෝන් මහත්මිය, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරියක වශයෙන්ද,
176. සච්චිතානන්දම් මදිතයන් මහතා, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
177. යූසුෆ් නවාස් මහතා, මඩකලපුව අධිකරණ කලාපය සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
178. තිල්ලෙයිනායගම් නාගනාදන් මහතා, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
179. කුලන්තයිවඩිවේල් ජෙගනාදන් මහතා, මඩකලපුව අධිකරණ කලාපය සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
180. ජෙයිනුලාබ්දීන් මොහමඩ් අසාර් මහතා, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
181. අම්මාසි චන්ද්‍රකලා මහත්මිය, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරියක වශයෙන්ද,
182. අමිතා දිනේෂා කුමාරි පිටියේකුඹුර මහත්මිය, නුවරඑළිය අධිකරණ කලාපය සඳහා සාමදාන විනිශ්චයකාරවරියක වශයෙන්ද,
183. අබ්දුල් සමත් මොහමඩ් යාසීර් මහතා, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
184. දිසානායක ආරච්චිලාගේ චමිල චම්පික කුමාර මහතා, ගම්පහ අධිකරණ කලාපය සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
185. මානික්කවාසගර් ශ්‍රීස්කන්දකුමාර් මහතා, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
186. සෙයිනුල් ආබ්දීන් ආරිෆ් අහමඩ් මහතා, මහනුවර අධිකරණ කලාපය සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
187. රුවන් පතිරණගේ චන්දන චන්ද්‍රනාත් සරත්චන්ද්‍ර මහතා, මීගමුව අධිකරණ කලාපය සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
188. ජයසිංහ ආරච්චිගේ දොන් නිර්මලී මල්සිරි නිලාමණී මහත්මිය, හලාවත අධිකරණ කලාපය සඳහා සාමදාන විනිශ්චයකාරවරියක වශයෙන්ද,
189. සෙයඩ් මොහමඩ් නජීම් මහතා, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
190. අලංකාරගේ රොබට් සෙනෙවිරත්න මහතා, අනුරාධපුර අධිකරණ කලාපය සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
191. මානෙල්පුර දේවගේ රත්නසූරිය මහතා, අනුරාධපුර අධිකරණ කලාපය සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
192. මුස්තාෆා මුස්තකීම් මහතා, අනුරාධපුර අධිකරණ කලාපය සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,

193. පාලම්පිටියේ ගෙදර විහඟ නිමේෂ් තිලකරත්න මහතා, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
194. මුහම්මදු ස්මායිල් මුහම්මදු නුහ්මාන් මහතා, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
195. දහම්පත් මුදියන්සේලාගේ ගුණතිලක බණ්ඩා දහම්පත් මහතා, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
196. රාජපක්ෂ ආරච්චිලාගේ කල්‍යාණි නන්දනී මහත්මිය, රත්නපුර අධිකරණ කලාපය සඳහා සාමදාන විනිශ්චයකාරවරියක වශයෙන්ද,
197. මුහම්මදු ඉස්මායිල් මුහම්මදු නසාර් මහතා, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
198. බද්ද විතානගේ සුමනාවතී මහත්මිය, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරියක වශයෙන්ද,
199. සෙල්වනායගම් ශ්‍රීක්‍රිෂ්ණරාසා මහතා, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
200. අබ්දුල් කාදර් හාජියාර් මුහම්මදු මුස්ඉල් මහතා, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
201. පතිරාජ මුදියන්සේලාගේ ජයසුමන චන්ද්‍රවන්ස පතිරාජ මහතා, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
202. වරල්වත්තේ ගෙදර පුංචිබණ්ඩා මහතා, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
203. මුහම්මදු අලි මුහම්මදු අන්වර් මහතා, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
204. වන්නිනායක මුදියන්සේලාගේ සාලිත බංඩාර මහතා, කොළඹ අධිකරණ කලාපය සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
205. මොහමඩ් ඉසදීන් මොහමඩ් සියාද් මහතා, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
206. මොහමඩ් කාටුබාවා හබීබු මොහමඩ් මහතා, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
207. ජෙයිනුල් ආබ්දීන් අල්හසාද් මහතා, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
208. ෆාතිමා රයිසා මහත්මිය, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරියක වශයෙන්ද,
209. සින්න තම්බි මුහම්මදු රසීන් මහතා, මඩකලපුව අධිකරණ කලාපය සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
210. තනිපෙල මුදියන්සේලාගේ සමන්ත කීර්ති බණ්ඩාර මහතා, අනුරාධපුර අධිකරණ කලාපය සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
211. මොහොම්මදු මන්සූර් මොහොම්මදු පාසික් මහතා, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
212. ගජහින් ගමගේ කරුණාදාස මහතා, හම්බන්තොට අධිකරණ කලාපය සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
213. අබ්දුල් ජලීල් මුහම්මදු ඉර්ෂාද් මහතා, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
214. පූජ්‍ය තිබ්බටුගොඩ නන්ද ස්වාමීන්වහන්සේ, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
215. මල්ලිකා ආරච්චිගේ දොන් පියසිංහ මහතා, කොළඹ අධිකරණ කලාපය සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
216. ජී. බී. අබේසිංහ මහතා, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
217. අබ්දුල් ලතීෆ් මොහමඩ් නලීම් මහතා, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
218. හල්නෙත්ති බැන්ඩික් පෙරේරා මහතා, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,
219. ලත්වාහන්දි හාතිය තිස්ස ද සිල්වා මහතා, මුළු දිවයින සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන්ද,

පත් කරමි.

**රවුෆ් හකීම්,**
අධිකරණ අමාත්‍ය.

2013 ජූනි මස 17 වැනි දින,
කොළඹ 12,
අධිකරණ අමාත්‍යාංශයේ දී ය.

07-114

---

# රජයේ නිවේදන

## වන්දනා ගමන් ආඥාපනත

රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යවරයා විසින් (175 වැනි අධිකාරය වූ) වන්දනා ගමන් ආඥාපනතේ 2 වැනි වගන්තිය යටතේ සාදනු ලබන නියෝග.

ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න,
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍ය.

රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

### නියෝග

1. මේ නියෝග මාළිගාවිල පුරාණ රජමහා විහාරස්ථානයේ බිනර මහ පෙරහැර නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. මේ නියෝගවල-

"කඳවුරු පෙදෙස" යන්නෙන් මෙහි උපලේඛනයෙහි විස්තර කරනු ලැබ ඇති ප්‍රදේශ අදහස් වේ;

"දිස්ත්‍රික් ලේකම්/දිසාපති" යන්නෙන් මොණරාගල පරිපාලන දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා අදහස් වන අතර, ඔහු විසින් 4 වැනි නියෝගය යටතේ බලය පවරනු ලැබූ යම් නිලධාරියෙක් ද ඊට ඇතුළත් වේ;

"වෛද්‍ය නිලධරයා" යන්නෙන් කඳවුරු පෙදෙස භාර සෞඛ්‍ය වෛද්‍ය නිලධරයා අදහස් වේ;

"වන්දනාකරු" යන්නෙන් කඳවුරු පෙදෙසට ඇතුළත් වී කවර හෝ කාර්යයක් සඳහා කඳවුරු පෙදෙස තුළ නතර වී තිබෙන යම් තැනැත්තෙක් අදහස් වේ;

"මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා" යන්නෙන් කඳවුරු පෙදෙස භාර මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා අදහස් වේ.

3. මේ නියෝග මොණරාගල පරිපාලන දිස්ත්‍රික්කයේ මාළිගාවිල පුරාණ රජමහා විහාරස්ථානයේ බිනර මහ පෙරහැර සඳහා කෙරෙන වන්දනා ගමන් සම්බන්ධයෙන් අදාළ වන්නේ ය.

4. මේ නියෝග යටතේ දිස්ත්‍රික් ලේකම්/දිසාපති වෙත පැවරී ඇති යම් බලයක් ක්‍රියාත්මක කිරීම සඳහා සහ නියම වී ඇති යම් කාර්යයක්

ඉටු කිරීම සඳහා යම් රජයේ නිලධාරියකු වෙත ලිඛිතව බලය පැවරීමට දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයාට බලය ඇත්තේ ය.

5. (i) කඳවුරු පෙදෙස තුළට හෝ කඳවුරු පෙදෙසින් පිටතට හෝ කඳවුරු පෙදෙස ඇතුළත හෝ වාහන ගමනා ගමනය හෝ පයින් ගමන් කිරීම විධිමත් කිරීමට දිස්ත්‍රික් ලේකම්/දිසාපති වරයාට බලය ඇත්තේ ය.

(ii) මේ නියෝගයේ (i) වැනි ඡේදයේ තමා වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරීමෙහිලා දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින් යම් පොලිස් නිලධරයෙකුට දෙන ලද උපදෙස්වලට අනුකූලව එම පොලිස් නිලධරයා විසින් කරනු ලබන යම් නීත්‍යානුකූල නියමයකට පටහැනිව කිසිම තැනැත්තෙකු විසින් ක්‍රියා නොකරනු ලැබිය යුතු ය.

6. දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයාගේ ලිඛිත අවසරය නොමැතිව කිසිම තැනැත්තෙකු විසින් කිසිම ගවයකු හෝ වෙනත් යම් සතෙකු හෝ කඳවුර පෙදෙස තුළට ගෙන ඒම නොකළ යුතු ය.
එසේ වුව ද, 7 වැනි නියෝගය යටතේ කරත්ත හා ගොනුන් නවතා තැබීම සඳහා වෙන් කරනු ලැබ ඇති ස්ථානයක් කරා, කරත්ත ගෙනයාම හෝ ගොනුන් දක්කාගෙන යාම හෝ සම්බන්ධයෙන් අවසර ලබා ගැනීම අවශ්‍ය නොවන්නේ ය.

7. (1) කඳවුර පෙදෙස ඇතුළත පහත සඳහන් ස්ථාන වෙන් කර තැබීමට හෝ සැපයීමට දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයාට බලය ඇත්තේ ය :

(අ) බස්රථ හා වෙනත් මෝටර් වාහන නවතා තබන ස්ථාන ;
(ආ) කරත්ත නවත්වා තැබීමේ හා ගොනුන් බැඳ තැබීමේ ස්ථාන ;
(ඇ) එක් එක් වන්දනා නඩයට නවාතැන් ගැනීම පිණිස වෙන වෙනම ස්ථාන ;
(ඈ) අසනීපවන වන්දනාකරුවන් සඳහා සුරැකුම් ස්ථාන ;
(ඉ) සිඟමන් යැදීමට සහ පිනට ඉල්ලා ගැනීම් කිරීම සඳහා ස්ථාන ;
(ඊ) විකිණීම සඳහා යම් ද්‍රව්‍ය ප්‍රදර්ශනය කරනු ලබන ස්ථාන ;
(උ) වෙනත් පුහුණු කටයුතු සඳහා තාවකාලික මඩු ඉදි කිරීමට හැකි ස්ථාන ;
(ඌ) සේදීමේ සහ ස්නානය කිරීමේ කාර්යය සඳහා වන්දනාකරුවන්ගේ ප්‍රයෝජනය පිණිස වූ ස්ථාන ;
(එ) බීමට ජලය ලබා ගැනීම සඳහා වන්දනා කරුවන්ගේ ප්‍රයෝජනය පිණිස වූ වැව්, ළිං, දිය වලවල් හා, සහ එවැනි පහසුකම් සලසන වෙනත් සථාන ;
(ඒ) අවශ්‍ය යැයි දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා සලකන වෙනත් කාර්යයන් සඳහා වූ ස්ථාන.

(2) අවශ්‍ය යැයි දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා සලකනු ලැබුවහොත් ඔහු විසින් (1) වැනි ඡේදයේ නිශ්චිතව සඳහන් පරිදි යම් ප්‍රදේශයක් වෙන් කරනු ලැබ ඇත්තේ කවර කාර්යයක් සඳහාදැයි දැක්වෙන දැන්වීමක් හෝ නාම පුවරුවක් එකී එක් එක් ස්ථානයෙහි තැබීමට කටයුතු සැලැස්විය හැකිය.

(3) (1) වැනි ඡේදය යටතේ වූ යම් කාර්යයක් සඳහා යම් ස්ථානයක් වෙන් කරනු ලැබූ හෝ සපයනු ලැබ ඇති අවස්ථාවක දී ඒ ස්ථානය හුදෙක් එම කාර්යය සඳහා පමණක්ම පාවිච්චි කරනු ලැබිය යුතු අතර, කඳවුරු පෙදෙස ඇතුළත වෙනත් කිසිම ස්ථානයක් එම කාර්යය සඳහා කිසිම තැනැත්තෙකු විසින් පාවිච්චි නොකරනු ලැබිය යුතු ය.

8. රෝග වළක්වාලීම සඳහා කඳවුරු පෙදෙස තුළ යම් වැවකට, ළිඳකට, දිය වලකට හෝ ජලාශයකට ක්ලෝරීන් යෙදීම හෝ යම් වැවක්, ළිඳක්, දිය වලක් හෝ ජලාශයක් වසා දැමීම හෝ අවශ්‍ය යැයි දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයාට හෝ වෛද්‍ය නිලධරයාට හෝ බලය ඇත්තේ ය.

9. (1) දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින් තත් කාර්යය සඳහා නිකුත් කරන ලද අවසර පත්‍රයක බලය මත සහ එවැනි අවසර පත්‍රයක සඳහන් කරනු ලැබිය හැකි යම් කොන්දේසිවලට අනුකූලව මිස, යම් තැනැත්තෙකු විසින් 7 වැනි නියෝගය යටතේ යම් කාර්යයක් සඳහා කඳවුරු පෙදෙස් තුළ වෙන් කරනු ලැබ තිබෙන හෝ සපයනු ලැබ තිබෙන යම් මඩුවක් හෝ යම් තාවකාලික හෝ ස්ථිර ඉදිකිරීමක් හෝ තැනීම හෝ දැනට පවත්නා යම් ගොඩනැගිල්ලකට අලුතින් කොටසක් එකතු කිරීම හෝ නොකරනු ලැබිය යුතු ය.

(2) යම් තැනැත්තෙකු විසින් මේ නියෝගයේ (1) වැනි ඡේදයට පටහැනි වන පරිදි යම් මඩුවක් හෝ යම් තාවකාලික හෝ ස්ථිර ඉදිකිරීමක් සාදනු ලැබීම හෝ දැනට පවත්නා යම් ගොඩනැගිල්ලකට හෝ ඉදි කිරීමකට අලුතින් කොටසක් තැනීම හෝ එකතු කිරීම හෝ කරනු ලැබුවහොත් ඒ තැනැත්තා වෙත ලිඛිත දැන්වීමක් භාර දීමෙන් පසු එම දැන්වීමේ සඳහන් කරනු ලබන කාල සීමාව ඇතුළත අවස්ථාවෝචිත පරිදි එම මඩුව හෝ ඉදි කිරීම හෝ දැනට පවත්නා ගොඩනැගිල්ලකට අලුතින් එකතු කරන ලද කොටස හෝ ඉවත් කරන ලෙස හෝ කඩා දමන ලෙස දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින් එම තැනැත්තාට නියම කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

(3) මෙම නියෝගයේ (2) ඡේදය යටතේ දැන්වීමක් භාර දෙනු ලැබූ යම් තැනැත්තෙකු විසින් එහි සඳහන් කාල සීමාව තුළ ඒ දැන්වීමේ නියමයන්ට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හරිනු ලැබූ අවස්ථාවක හෝ එම දැන්වීම භාර දෙනු ලැබිය යුතු නියම තැනැත්තා කවරෙක් ද යන්න පිළිබඳව සැකයක් උද්ගත වන අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි, ඒ මඩුව හෝ ඉදිකිරීම හෝ දැනට පවත්නා යම් ගොඩනැගිල්ලකට අලුතින් එකතු කරන ලද කොටස හෝ ඉවත් කිරීමට හෝ කඩා දැමීම සඳහා අවශ්‍ය වන කම්කරුවන්, උපකරණ සහ යන්ත්‍රෝපකරණ සහිතව දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින් යම් ඉඩමකට හෝ පරිශ්‍රයකට ඇතුළුවනු ලැබීම ද, එම ඉවත් කිරීම හෝ කඩා දැමීම සඳහා අවශ්‍ය වන සියලු දේ කිරීම හෝ එසේ කිරීමට දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින් සලස්වනු ලැබීම ද නීත්‍යානුකූල වන්නේ ය.

10. වන්දනාකරුවන්ගේ ප්‍රයෝජනය සඳහා වෙන් කරන ලද බවට දැන්වීමක් හෝ සංඥා පුවරුවක් මගින් පෙන්වා ඇති යම් වැසිකිලියක හැර කිසිම තැනැත්තෙකු විසින් කඳවුරු පෙදෙස තුළ මළ මුත්‍රා පහ කිරීම නොකරනු ලැබිය යුතු ය.

11. කඳවුරු පෙදෙස තුළ යම් වැවක, ළිඳක, දිය වලක, ජලාශයක, ඇළක දොළක හෝ දිය පාරක ඇති ජලය කිසිම තැනැත්තෙකු විසින් අපිරිසිදු නොකරනු ලැබිය යුතු ය.

12. කැළිකසළ දැමීම සඳහා දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින් සපයනු ලැබ ඇති ස්ථානයකට හෝ භාජනයකට මිස කිසිම තැනැත්තෙකු විසින් කඳවුරු පෙදෙස තුළ ද්‍රව්‍යමය හෝ ද්‍රව්‍යමය කැළිකසළ දැමීම නොකරනු ලැබිය යුතු ය.

13. (1) කඳවුරු පෙදෙස තුළ වන්දනාකරුවන්ට පිසූ ආහාර පාන බෙදා හැරීමේ විධිමත් කිරීමේ බලය දිස්ත්‍රික් ලේකම්/ දිසාපතිවරයාට ඇත්තේ ය.

(2) තමා වෙත මේ නියෝගයේ (1) වැනි ඡේදය යටතේ පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරීමෙහි ලා දිස්ත්‍රික් ලේකම්/ දිසාපතිවරයා විසින් දෙනු ලබන උපදෙස්වලට අනුකූලව යම් පොලිස් නිලධරයකු විසින් හෝ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයකු විසින් හෝ දෙනු ලබන යම් නීත්‍යානුකූල නියමයකට කිසිම තැනැත්තෙකු අකීකරු නොවිය යුතු ය.

14. (1) කඳවුරු පෙදෙස තුළ විකිණීම සඳහා වන්දනාකරුවන්ට බෙදා දීම සඳහා ප්‍රදර්ශනය කරනු ලැබ ඇති හෝ තබා ඇති යම් ආහාරයක් හෝ පානයක් අපවිත්‍ර වී ඇති බව හෝ මනුෂ්‍ය පරිභෝජනය සඳහා නුසුදුසු වී ඇති බව පෙනී ගිය අවස්ථාවක දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින් හෝ වෛද්‍ය නිලධාරිවරයා විසින් හෝ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා විසින් හෝ ඒ ආහාරය හෝ පානය මනුෂ්‍ය පරිභෝජනයට නුසුදුසු බවට ප්‍රකාශ කරනු ලැබිය හැකිය.

(2) මේ නියෝගයේ (1) වැනි ඡේදය යටතේ මනුෂ්‍ය පරිභෝජනයට නුසුදුසු බවට ප්‍රකාශ කරන ලද ආහාරයක් හෝ පානයක් කිසිම තැනැත්තෙකු විසින් කඳවුරු පෙදෙස තුළ විකිණීම හෝ බෙදා හැරීම හෝ නොකරනු ලැබිය යුතු ය.

(3) මෙම නියෝගයේ (1) වැනි ඡේදය යටතේ මනුෂ්‍ය පරිභෝජනයට නුසුදුසු බවට ප්‍රකාශ කරන ලද යම් ආහාරයක් හෝ පානයක් විකිණීම හෝ බෙදා හැරීම තහනම් කිරීම සහ ඒවා විනාශ කිරීම යම් පොලිස් නිලධරයෙකු විසින් හෝ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයෙකු විසින් තහනමට ගෙන විනාශ කර දමනු ලැබීම නීත්‍යානුකූල වන්නේ ය.

15. බේකරියක්, රස කැවිලි හලක්, හෝ රස කැවිලි නිෂ්පාදනාගාරයක්, භෝජනාගාරයක් හෝ දන්සැලක් පවත්වාගෙන යාම සඳහා දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින් නිකුත් කරන ලද බලපත්‍රයක බලය මත සහ ඒ බලපත්‍රයේ සඳහන් කොන්දේසිවලට අනුකූලව මිස කිසිම තැනැත්තෙකු විසින් 7 වැනි නියෝගය යටතේ යම් කාර්යයක් සඳහා වෙන් කරනු ලැබ තිබෙන හෝ සපයනු ලැබ තිබෙන ස්ථානයක හෝ කඳවුරු පෙදෙස තුළ අන් ස්ථානයක හෝ එවැනි බේකරියක්, රස කැවිලි හලක් හෝ රස කැවිලි සාදන ස්ථානයක් හෝ භෝජනාගාරයක් හෝ දන්සැලක් පිහිටුවීම හෝ පවත්වාගෙන යාම නොකරනු ලැබිය යුතුය. සෑම බලපත්‍රයක්ම වෛද්‍ය නිලධරයාගේ හෝ වෛද්‍ය නිලධරයා විසින් බලය දෙනු ලැබූ වෙනත් යම් තැනැත්තෙකුගේ හෝ නිර්දේශය මත ගාස්තුවකින් තොරව නිකුත් කරනු ලැබිය යුතු ය.

16. කඳවුරු පෙදෙස තුළ ඇති සියලුම බේකරි, රස කැවිලි හල්, රස කැවිලි සාදන ස්ථාන, භෝජනාගාර සහ දන්සැල් සහ ඒවායේ ඇති සියලු ගෘහ භාණ්ඩ සහ උපකරණ පිරිසිදු සහ සනීපාරක්ෂාවට හිතකර තත්ත්වයකින් තබා ගත යුතු ය.

17. කඳවුරු පෙදෙස ඇතුළත විකිණීම සඳහා හෝ බෙදා හැරීම සඳහා හෝ ප්‍රදර්ශනය කරනු ලැබ ඇති හෝ තබා ඇති සියලුම කේක් වර්ග, රස කැවිලි සහ පිසින ලද ආහාර වෛද්‍ය නිලධරයා හෝ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා හෝ සෑහීමකට පත්වන පරිදි මැස්සන්ට ඇතුල්විය නොහැකි පරිදි නිසි ලෙස තනන ලද වීදුරු ආවරණය තුළ තැබීම කරනු ලැබිය යුතු ය.

18. තේ අපද්‍රව්‍ය, කෝපි අපද්‍රව්‍ය, කිරි අපද්‍රව්‍ය හෝ යම් ආහාරයක හෝ පානයක ඉතිරි වූ කොටස් හෝ පිසීමේ දී හෝ අන් අයුරකින් ඉවතලන ද්‍රව්‍ය හෝ කඳවුරු පෙදෙසේ කිසිම ස්ථානයක අනාවරණයව නොතිබිය යුතු ය. එවැනි සියලු අපද්‍රව්‍ය ඉතුරු වූ කොටස් හෝ ඉවතලන ද්‍රව්‍ය 19 වැනි නියෝගයෙහි විධිවිධාන සලසා ඇති ආකාරයට තබා ඇති භාජනයකට දැමිය යුතු ය. එවැනි සියලු අපද්‍රව්‍ය, කසළ හෝ ඉවතලන ද්‍රව්‍ය කිසිවක් කඳවුරු පෙදෙස ඇතුළත යම් ස්ථානයක හෝ ඒ අසළ පොළවේ විසිකොට තිබෙන බව පෙනී ගියහොත් ඒ ස්ථානයෙහි අයිතිකරු විසින් හෝ ප්‍රධාන පදිංචිකරු විසින් හෝ ඒ ස්ථානය බේකරියක්, රස කැවිලි හලක්, රස කැවිලි සාදන ස්ථානයක්, භෝජනාගාරයක් හෝ දන්සැලක් වන අවස්ථාවක ඒ ස්ථානයේ බලපත්‍රධාරියා විසින් හෝ එම වරද සිදුවීම වැළැක්වීමට අවශ්‍ය සියලුම පූර්වෝපාය යෙදූ බව සහ නිසි සැලකිල්ලෙන් ක්‍රියා කළ බව ඔප්පු කරනු ලැබුවහොත් මිස එකී අයිතිකරු හෝ ප්‍රධාන පදිංචිකරු හෝ එකී බලපත්‍රලාභියා හෝ මේ නියෝගයේ විධිවිධාන කඩකර ඇති ලෙස සලකනු ලැබේ.

19. කඳවුරු පෙදෙස තුළ පිහිටි සියලු බේකරි, රස කැවිලි හල්, රස කැවිලි සාදන ස්ථාන, භෝජනාගාර, දන්සැල් සහ වෙළඳ හෝ ව්‍යාපාරික කාර්යයක් සඳහා පාවිච්චි කරනු ලබන ගොඩනැගිලි හෝ ඉදිකිරීම් සඳහා ඝන මීටර් 1 1/2කට (ඝන අඩි 4 1/2ට) නොඅඩු ධාරිතාවයක් ඇති දැවමය, ලෝහමය හෝ ප්ලාස්ටික් කසළ බඳුනක් සපයනු ලැබිය යුතු අතර, එකී කසල බඳුන එහි කසළ තැන්පත් කරනු ලබන විට හෝ ඉන් කසළ ඉවත් කරනු ලබන විට හැර වෙනත් සෑම අවස්ථාවකදීම දැවමය, ලෝහමය, ප්ලාස්ටික්, පියනකින් වසා තැබිය යුතු ය.

20. (1) දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයාගේ මතය අනුව මෙය නියෝග වල 16, 17, 18 හෝ 19 වැනි නියෝග කඩකරමින් පිහිටුවනු ලැබ ඇත්තා වූ හෝ පවත්වාගෙන යනු ලබන්නා වූ ද, යම් බේකරියක්, කැවිලි හලක් හෝ කැවිලි සාදන ස්ථානයක්, භෝජනාගාරයක්, දන්සැලක් හෝ යම් වෙළඳ ව්‍යාපාරික ස්ථානයක් වසා දැමීමට නියම කිරීමේ හා ඒ ස්ථානය වෙනුවෙන් යම් බලපත්‍රයක් නිකුත් කරනු ලැබ තිබේ නම්, එකී බලපත්‍රය වහාම අවලංගු කිරීමේ බලය දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයාට ඇත්තේ ය.

(2) යම් බේකරියක් හෝ කැවිලිහලක්, හෝ කැවිලි සාදන ස්ථානයක් හෝ භෝජනාගාරයක් හෝ දන්සැලක් හෝ යම් වෙළඳ ව්‍යාපාරික ස්ථානයක් බාරව සිටින යම් තැනැත්තෙකු විසින් මේ වගන්තියේ (1) වැනි ඡේදය යටතේ දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයාගේ යම් නීත්‍යණුකූල විධානයකට අනුකූලව ක්‍රියා කළ යුතු ය.

21. යම් ආසාදන රෝගයකින් හෝ ස්පර්ශක රෝගයකින් පෙළෙන කිසිම තැනැත්තෙක් කඳවුරු පෙදෙස තුළට ඇතුලු නොවිය යුතු ය.

22. (i) කඳවුරු පෙදෙස තුළ යම් වසංගත රෝගයක් පැතිරී යන විටක දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින් වන්දනා කරුවන්ට කඳවුරු පෙදෙසින් වහාම පිටවන ලෙස නියම කරනු ලැබීම ද, ඉවත්ව යා යුතු ගමන් මාර්ගය සහ ඉවත්ව යාමේ දී උපයෝගී කරගත යුතු ප්‍රවාහන ක්‍රමය හා පිළිවෙල දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින් නියම කරනු ලැබීමද නීත්‍යානුකූල වන්නේ ය.

(ii) දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින් මෙම වගන්තියේ (i) වැනි ඡේදය යටතේ දෙනු ලබන යම් නීත්‍යානුකූල නියමයකට පටහැනිව කිසිම තැනැත්තෙක් ක්‍රියා නොකළ යුතු ය.

23. කඳවුරු පෙදෙස තුළ යම් වසංගත රෝගයක් හෝ ස්පර්ශක රෝගයක් වැළඳී ඇති සෑම තැනැත්තෙක්ම ද, එසේ යම් ආසාදන රෝගයක් හෝ ස්පර්ශක රෝගයක් වැළඳී ඇති බව දැන දැනම ඒ තැනැත්තා සමග එකට වාසය කරන සෑම තැනැත්තෙක්ම ද, ඒ බව වෛද්‍ය නිලධරයාට හෝ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයාට හෝ යම් පොලිස් නිලධරයෙකුට හෝ වහාම වාර්තා කළ යුතු ය.

24. ආසාදන රෝගයකින් හෝ ස්පර්ශක රෝගයකින් පෙළෙන හෝ පෙළෙන්නේ යැයි තමා දන්නා කිසිම තැනැත්තෙකුට කඳවුරු පෙදෙස ඇතුළත යම් බේකරියක්, කැවිලි හලක් හෝ කැවිලි සාදන ස්ථානයක් භෝජනාගාරයක් හෝ දන්සැලක් තත් කාලයේ භාරව සිටින යම් තැනැත්තෙකු විසින් අවස්ථාවෝචිත පරිදි ඒ බේකරියට, කැවිලිහලට හෝ කැවිලි සාදන ස්ථානයකට, භෝජනාගාරයට හෝ දන්සැලට ඇතුළුවීමට හෝ යම් ද්‍රව්‍යයක් හෝ ආහාර පාන හෝ බෙදා හැරීමේ දී, විකිණීමේ දී හෝ නිෂ්පාදනය කිරීමේ දී හෝ සහභාගී වීමට හෝ ඉඩ නොදෙනු ලැබිය යුතු ය.

25. යම් බේකරියක, කැවිලි හලක හෝ කැවිලි සාදන ස්ථානයක, භෝජනාගාරයක හෝ දන්සැලක බලපත්‍රධාරියෙකු විසින් හෝ යම් නවාතැන්පළක හෝ වන්දනාකරුවන්ගේ විශ්‍රාම ශාලාවක අයිතිකරු හෝ ප්‍රධාන පදිංචිකරු විසින් ආසාදන රෝගයකින් හෝ ස්පර්ශක රෝගයකින් හෝ පෙළෙන යම් තැනැත්තෙකුට අවස්ථාවෝචිත පරිදි ඒ බේකරියේ, කැවිලිහලේ හෝ කැවිලි සාදන ස්ථානයේ භෝජනාගාරයේ, දන්සැලේ නවාතැන්පලේ හෝ වන්දනා කරුවන්ගේ විශ්‍රාම ශාලාවේ කවර හෝ කාලසීමාවක් නැවතී සිටීමට ඉඩ නොදිය යුතු ය. එවැනි ස්ථානයක ආසාදන රෝගියෙකු හෝ ස්පර්ශක රෝගියෙකු සිටින බව අනාවරණය වූ අවස්ථාවක අවස්ථාවෝචිත පරිදි එහි බලපත්‍රධාරී විසින් හෝ අයිතිකරු හෝ ප්‍රධාන පදිංචිකරු විසින් හෝ එම කරුණ වහාම වෛද්‍ය නිලධාරියාට හෝ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයාට හෝ යම් පොලිස් නිලධාරියෙකුට වාර්තා කළ යුතු ය.

26. 7 වැනි නියෝගය යටතේ හිඟමන් යැදීම හෝ පිනට ඉල්ලා ගැනීම සඳහා වෙන් කරනු ලැබ ඇති හෝ සපයනු ලැබ ඇති යම් ස්ථානයක දී හැර කඳවුරු පෙදෙස තුළ මුදලින් හෝ යම් වෙනත් ආකාරයකින් හෝ කිසිම තැනැත්තෙකු විසින් පිනට දීම හෝ පිනට යමක් බෙදා හැරීම හෝ නොකළ යුතු ය.

27. දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයාගේ ලිඛිත අවසරයක් නොමැතිව කිසිම තැනැත්තෙකු විසින් කඳවුරු පෙදෙස තුළ ගිනිකෙළි භාණ්ඩ හෝ ගිනි අවි කිසිවක් පත්තු කිරීම නොකළ යුතු ය.

28. 7 වැනි නියෝගය හෝ 10 වැනි නියෝගය යටතේ යම් ස්ථානයක ප්‍රදර්ශනය කරනු ලැබ ඇති යම් දැන්වීමක් හෝ නාම පුවරුවක් කිසිම තැනැත්තෙකු විසින් අයුතු ලෙස වෙනස් කිරීම හෝ ඉවත් කිරීම නොකළ යුතු ය.

29. දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා, වෛද්‍ය නිලධරයා, මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා, හෝ යම් පොලිස් නිලධරයෙකු විසින්,

(අ) මේ නියෝග අතුරෙන් යම් නියෝගයක් හෝ ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා කඳවුරු පෙදෙස තුළ ඇති යම් ඉඩමකට හෝ ස්ථානයකට හෝ ඇතුළුවීම ; සහ,

පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් අසූතුන්ලක්ෂ හතලිස් එක් දහස් එකසිය අසූ දෙකයි ශත හතලිස් නවය (රු. 8,341,182.49) ක මුදලක් 2011 මාර්තු මස 14 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී ට අයවිය යුතුව හා ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 8,341,182.49 ක මුදලට 2011 මාර්තු මස 15 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද, ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු හා මුදල් ප්‍රමාණයන් ද, තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එම මුදල අඩු කොට එකී අංක 2302 දරන උකස් බැදුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී වෙත උකස් කොට ඇත්තා වූ ද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තා වූ ද දේපළ හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු පී. මුතුකුමාරණ ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මෙමගින් යෝජනාව සම්මත කර ගනී.

## උපලේඛනය

1. සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, කුකුල් කෝරළේ උඩ පත්තුවේ, කලවාන ප්‍රාදේශීය සභා සීමාව තුළ ගන්ගලගමුව ගමෙහි පිහිටි "ගන්ගලගමුව එස්ටේට්" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. රාමක්‍රිෂ්ණන් විසින් මැන සාදන ලද අංක 2989/08 සහ 2008 ජුනි මස 22 වන දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද "ලොට් ඒ" ලෙස ලකුණු කර ඇති ඉඩම් කොටස වන උතුරට : ගන්ගලගමුව එස්ටේට් 1107 වලින්ද, නැගෙනහිරට : පිඹුරු අංක 10166, 1111 දරන පිඹුරෙන් ද සහ වෙන් කරන ලද පාරෙන් ද, දකුණට : දොලෙන් ද සහ පිඹුරු අංක 2050 අයත් පන්විලදෙනියෙන් ද සහ බස්නාහිරට : දොලෙන් ද මායිම් වූ අක්කර හතයි, රූඩ් දෙක (අ. 7, රූ. 2, පර්. 0) ක් විශාල අංක 2989/08 දරන පිඹුර තුළ ඇති ගොඩනැගිලි සහ අනෙකුත් සියළුම දේත් සමග පිහිටි ඉඩම වේ.

2. සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, කුකුල් කෝරළේ උඩ පත්තුවේ, කලවාන ප්‍රාදේශීය සභා සීමාව තුළ ගන්ගලගමුව ගමෙහි පිහිටි "ගන්ගලගමුව එස්ටේට්" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. රාමක්‍රිෂ්ණන් විසින් මැන සාදන ලද අංක 2989/08 සහ 2008 ජුනි මස 22 වැනි දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද "ලොට් බී" ලෙස ලකුණු කර ඇති ඉඩම් කොටස වන උතුරට : ගන්ගලගමුව එස්ටේට් 1107 වලින්ද, නැගෙනහිරට : අන්නක්කගලහේනයාය 1124, අංක 1127 2/2, පී. ඩිංගිරිය සහ අනෙක් අය හිමිකම් කියන එම ඉඩමේම ඉතිරි කොටසින් ද, දකුණට : ගම් ඇටිකුලනහේන 1127, 1128, 1130න් ද, ගම් ඇටිකුලනහේන 290 ටී. පී. 171516, අන්කන්දවිටියල මූකලාන 1126, 2, 2,291 න් ද සහ බස්නාහිරට : පිඹුරු අංක 10166-1111ට අයත් කැකුණහේන 205, 209, කැකුණහේන කුඹුර 208න් ද, මායිම් වූ අක්කර තිස්පහයි, රූඩ් දෙකයි පර්චස් තිස්හතයි (අ. 35, රූ. 2, පර්. 37) ක් විශාල අංක 2989/08 දරන පිඹුර තුළ ඇති ගොඩනැගිලි සහ අනෙකුත් සියළුම දේත් සමග පිහිටි ඉඩම වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

**කේ. ඒ. එල්. ටී. රණවීර,**
සහකාර සාමාන්‍යාධිකාරිණී (නීති),
මාණ්ඩලික ලේකම්.

07-148/6

---

## සම්පත් බැංකුව පී. එල්. සී.
## (සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින් වූ)

2011 අංක 01 සහ 2011 අංක 19 මගින් සංශෝධිත 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වෙනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලද සම්මුතිය

සදර්න් සන් ටීස් (ප්‍රයිවට්) ලිමිටඩ්.
ගිණුම් අංක 0998 1000 4041.

සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2013 මැයි 30 වැනි දින පවත්වන්නට යෙදුන රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

සමාගම් ලියාපදිංචි අංක පීකිව් 144 දරන සම්පත් බැංකුව පීඑල්සී නමින් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එස්. වී. ඊ. විජේරත්න යන අය විසින් ලියා සහතිකකරනලද 2007 ජූලි 23 දාතම හා අංක 2942 දරන උකස් බැඳුම්කරය මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසු ගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සමාගම් නීතින් යටතේ නිසි ලෙස සංස්ථාගත කොට ඇති සමාගමක් වන ලියාපදිංචි අංක පීවී 11719 දරන සදර්න් සන් ටීස් (ප්‍රයිවට්) ලිමිටඩ් බන්ධනදායින් වශයෙන් පැහැර හැර ඇති හෙයින් ද එකී අංක 2942 දරන බැඳුම්කරය ප්‍රකාර අයවිය යුතු මුළු මුදල වශයෙන් ශ්‍රී ලංකා මුදලින් ඇමෙරිකා එක්සත් ජනපද ඩොලර් අනූ දහස් එකසිය දහතුනයි ශත හැත්තෑ නමයක (US$ 90,113.79) මුදලක් 2013 මාර්තු 12 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී ඇමෙරිකා එක්සත් ජනපද ඩොලර් අනූ දහස් එකසිය දහතුනයි ශත හැත්තෑ නමයක (US$ 90,113.79) මුදල ද, 2013 මාර්තු 13 දින සිට අංක 2942 දරන එකී බැඳුම්කරය මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, ඇමෙරිකා එක්සත් ජනපද ඩොලර් හැට හත් දහස් නමසිය දහයක (US$ 67,910) මුදලක් සඳහා වාර්ෂිකව සියයට හතක් (7%) බැගින් වූ පොලිය ද, දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදුවූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, අංක 2942 දරන එකී බැඳුම්කරය මගින් ලබා ගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස් කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන ෂොක්මන් සහ සමරවික්‍රම ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා ලිය යුතු යයි, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කර ගන්නා ලදී.

## උපලේඛනය

1. බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, රාගම් පත්තුවේ ජා-ඇල සහ කඳාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ ඒකල කුරුඳුවත්ත සහ කොටුගොඩ පිහිටි "ඕටීඑස් ඉඩම" යයි කියනු ලබන ඉඩමට (බලයලත් මානක තැන එම්. ටී. රත්නායක යන අය විසින් සාදන ලද 2003 නොවැම්බර් 25 දාතම හා අංක 2093 දරන පිඹුරේ ලොට් 1හි උප බෙදුමක් සහ නැවත මිනුමක් වන) බලයලත් මානක තැන එම්. ටී. රත්නායක යන අය විසින් සාදන ලද 2003 නොවැම්බර් 25 සහ 2004 ජනවාරි 23 දාතම හා අංක 2094 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන්කොට ලොට් 122 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම් උතුරට : මෙහි ලොට් 113, නැගෙනහිරට : මෙහි ලොට් 121, දකුණට : මෙහි ලොට් R17

(මීටර් 1.0 පළල කානුව සඳහා වෙන් කිරීම) සහ බස්නාහිරට : මෙහි ලොට් 123 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් හයයි දශම බිංදුවයි එකක් (අ. 0, රූ. 0, පර්. 6.01) විශාල ඉඩම් කොටස සමඟ පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියළු දේ සහ සියළුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවයන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබන්ධයන් ද සමඟ එකී අංක 2094 දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව බී 206/120 යටතේ මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

පහත සඳහන් ඉඩම් මතින් හා ඒ දිගේ පයින් ගමන් කිරීමේ හා වාහන ගමන් කිරීමේ, බඩු පැටවුම් හෝ බඩු බෑම් කිරීමේ මාර්ග අයිතිය සහ මෙම ඉඩම් මතින් ඒ දිගේ ඉහළින් සහ පොළොව යටින් විදුලි සහ සන්නිවේදන රැහැන්, ජලපවහන මලාපවහන සහ ජලනල සහ ඉහළින් ගමන් කරන රැහැන් ඇතිරීමේ සහ වෙනත් යාන්ත්‍රික උපකරණ සහ නිර්මාණ සහ පහසුකම්වල අයිතියද සමඟය.

(අ) බලයලත් මානක තැන එම්. ටී. රත්නායක යන අය විසින් සාදන ලද 2003 නොවැම්බර් 25 සහ 2004 ජනවාරි 23 දාතම හා අංක 2094 දරන පිඹුරේ නිරූපිත ලොට් R5, R16, R18 සහ R17.

(ආ) (මා. සං. අ.) මාර්ගය වෙත දිවෙන බලයලත් මානක තැන එම්. ටී. රත්නායක යන අය විසින් සාදන ලද 2001 නොවැම්බර් 05 සහ 07 දාතම හා අංක 1877 දරන පිඹුරේ නිරූපිත ලොට් 2 සහ 4.

2. එකී ඒකළ කුරුඳුවත්ත පිහිටි "ඕටීඑස් ඉඩම" යයි කියනු ලබන ඉඩමට අංක 2094 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන්කොට ලොට් 131 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම් උතුරට : මෙහි ලොට් 104, නැගෙනහිරට : මෙහි ලොට් 130, දකුණට : මෙහි ලොට් 17 (මීටර් 1.0 පළල කානුව සඳහා වෙන් කිරීම) සහ බස්නාහිරට : මෙහි ලොට් 132 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් හයයි දශම බිංදුවයි එකක් (අ. 0, රූ. 0, පර්. 6.01) විශාල ඉඩම් කොටස සමඟ පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියළු දේ සහ සියළුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවයන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබන්ධයන් ද සමඟ එකී අංක 2094 දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව බී 206/129 යටතේ මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

පහත සඳහන් ඉඩම් මතින් හා ඒ දිගේ පයින් ගමන් කිරීමේ හා වාහන ගමන් කිරීමේ, බඩු පැටවුම් හෝ බඩු බෑම් කිරීමේ මාර්ග අයිතිය සහ මෙම ඉඩම් මතින් ඒ දිගේ ඉහළින් සහ පොළොව යටින් විදුලි සහ සන්නිවේදන රැහැන් ජලාපවහන, මලාපවහන සහ ජලනල සහ ඉහළින් ගමන් කරන රැහැන් ඇතිරීමේ සහ වෙනත් යාන්ත්‍රික උපකරණ සහ නිර්මාණ සහ පහසුකම් වල අයිතියද සමඟය.

(අ) බලයලත් මානක තැන එම්. ටී. රත්නායක යන අය විසින් සාදන ලද 2003 නොවැම්බර් 25 සහ 2004 ජනවාරි 23 දාතම හා අංක 2094 දරන පිඹුරේ නිරූපිත ලොට් R5, R16, R18 සහ R17.

(ආ) (මා. සං. අ.) මාර්ගය වෙත දිවෙන බලයලත් මානක තැන එම්. ටී. රත්නායක යන අය විසින් සාදන ලද 2001 නොවැම්බර් 05 සහ 07 දාතම හා අංක 1877 දරන පිඹුරේ නිරූපිත ලොට් 2 සහ 4.

3. එකී ඒකළ කුරුඳුවත්ත පිහිටි "ඕටීඑස් ඉඩම" යයි කියනු ලබන ඉඩමට අංක 2094 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන්කොට ලොට් 160 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම් උතුරට : මෙහි ලොට් 151, නැගෙනහිරට : මෙහි ලොට් 159, දකුණට : මෙහි ලොට් R20 (මීටර් 1.0 පළල කානුව සඳහා වෙන් කිරීම) සහ බස්නාහිරට : මෙහි ලොට් 161 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් හයයි දශම බිංදුවයි එකක් (අ. 0, රූ. 0, පර්. 6.01) විශාල ඉඩම් කොටස සමඟ පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියළු දේ සහ සියළුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවයන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබන්ධයන් ද සමඟ එකී අංක 2094 දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව බී 189/272 යටතේ මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

පහත සඳහන් ඉඩම් මතින් හා ඒ දිගේ පයින් ගමන් කිරීමේ හා වාහන ගමන් කිරීමේ බඩු පැටවුම් හෝ බඩු බෑම් කිරීමේ මාර්ග අයිතිය සහ මෙම ඉඩම් මතින් ඒ දිගේ ඉහළින් සහ පොළොව යටින් විදුලි සහ සන්නිවේදන රැහැන් ජලාපවහන, මලාපවහන සහ ජලනල සහ ඉහළින් ගමන් කරන රැහැන් ඇතිරීමේ සහ වෙනත් යාන්ත්‍රික උපකරණ සහ නිර්මාණ සහ පහසුකම් වල අයිතිය ද සමඟය.

(අ) බලයලත් මානක තැන එම්. ටී. රත්නායක යන අය විසින් සාදන ලද 2003 නොවැම්බර් 25 සහ 2004 ජනවාරි 23 දාතම හා අංක 2094 දරන පිඹුරේ නිරූපිත ලොට් R21, R16 සහ R5.

(ආ) (මා. සං. අ.) මාර්ගය වෙත දිවෙන බලයලත් මානක තැන එම්. ටී. රත්නායක යන අය විසින් සාදන ලද 2001 නොවැම්බර් 05 සහ 07 දාතම හා අංක 1877 දරන පිඹුරේ නිරූපිත ලොට් 2 සහ 4.

4. එකී ඒකළ කුරුඳුවත්ත පිහිටි "ඕටීඑස් ඉඩම" යයි කියනු ලබන ඉඩමට අංක 2094 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන්කොට ලොට් 169 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම් උතුරට : මෙහි ලොට් 142, නැගෙනහිරට : මෙහි ලොට් 168, දකුණට : මෙහි ලොට් R20 (මීටර් 1.0 පළල කානුව සඳහා වෙන් කිරීම) සහ බස්නාහිරට : මෙහි ලොට් 170 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයන් පර්චස් හයයි දශම බිංදුවයි එකක් (අ. 0, රූ. 0, පර්. 6.01) විශාල ඉඩම් කොටස සමඟ පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියළු දේ සහ සියළුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවයන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබන්ධයන් ද සමඟ එකී අංක 2094 දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව බී 189/273 යටතේ මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

පහත සඳහන් ඉඩම් මතින් හා ඒ දිගේ පයින් ගමන් කිරීමේ හා වාහන ගමන් කිරීමේ, බඩු පැටවුම් හෝ බඩු බෑම් කිරීමේ මාර්ග අයිතිය සහ මෙම ඉඩම් මතින් ඒ දිගේ ඉහළින් සහ පොළොව යටින් විදුලි සහ සන්නිවේදන රැහැන් ජලාපවහන, මලාපවහන සහ ජලනල සහ ඉහළින් ගමන් කරන රැහැන් ඇතිරීමේ සහ වෙනත් යාන්ත්‍රික උපකරණ සහ නිර්මාණ සහ පහසුකම් වල අයිතිය ද සමඟය.

(අ) බලයලත් මානක තැන එම්. ටී. රත්නායක යන අය විසින් සාදන ලද 2003 නොවැම්බර් 25 සහ 2004 ජනවාරි 23 දාතම හා අංක 2094 දරන පිඹුරේ නිරූපිත ලොට් R21, R16 සහ R5.

(ආ) (මා. සං. අ.) මාර්ගය වෙත දිවෙන බලයලත් මානක තැන එම්. ටී. රත්නායක යන අය විසින් සාදන ලද 2001 නොවැම්බර් 05 සහ 07 දාතම හා අංක 1877 දරන පිඹුරේ නිරූපිත ලොට් 2 සහ 4.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

07-155

**සම්පත් බැංකුව පී.එල්.සී.**
**(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින් වූ)**

2011 අංක 01 සහ 2011 අංක 19 මගින් සංශෝධිත 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලද සම්මුතිය

පී. රමේෂ්.
ගිණුම් අංක : 0027 5001 3816.

සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2013 පෙබරවාරි 28 වැනි දින පවත්වන්නට යෙදුන රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

සමාගම් ලියාපදිංචි අංක පීකිව් 144 දරන සම්පත් බැංකුව පීඑල්සී නමින් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඩී. කේ. කේ. ගම්ලත් යන අය විසින් ලියා සහතික කරන ලද 2005 මැයි 06 දාතම හා අංක 859 දරන හා ඩබ්ලිව්. පී. කේ. විජේතුංග යන අය විසින් ලියා සහතික කරන ලද 2008 සැප්තැම්බර් 10 දාතම හා අංක 4184 දරන හා එන්. එම්. නාගොඩවිතාන යන අය විසින් සහතික කරන ලද 2011 මාර්තු 30 දාතම හා අංක 1078 දරන උකස් බැඳුම්කරය මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසු ගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පෙරියසාමි රමේෂ් යන අය බන්ධනදායින් වශයෙන් පැහැර හැර ඇති හෙයින් ද, එකී අංක 859, 4184 සහ 1078 දරන බැඳුම්කර ප්‍රකාර අයවිය යුතු මුළු මුදල වශයෙන් ශ්‍රී ලංකා මුදලින් රුපියල් පනස් හය ලක්ෂ හැත්තෑ තුන් දහස් හාරසිය පනස් පහයි ශත තිස් එකක (රු. 5,673,455.31) මුදලක් 2013 ජනවාරි 22 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් පනස් හය ලක්ෂ හැත්තෑ තුන් දහස් හාරසිය පනස් පහයි ශත තිස් එකක (රු. 5,673,455.31) මුදල ද, 2013 ජනවාරි 23 දින සිට අංක 859, 4184 සහ 1078 දරන එකී බැඳුම්කර මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් පනස් ලක්ෂයක (රු. 5,000,000) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහසයක් (16%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදුවූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, අංක 859, 4184 සහ 1078 දරන එකී බැඳුම්කර මගින් ලබා ගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස් කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, කොළඹ බලයලත් වෙන්දේසි කරුවන් වන පී. කේ. ඊ. සේනාපති ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා ලිය යුතු යයි, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කර ගන්නා ලදී.

උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරළේ රාගම් පත්තුවේ වත්තල-මාබෝල නගර සභා සීමාවන් තුළ වත්තල පිහිටි ඇවරිවත්ත පාර වරිපනම් අංක 204/8 දරන "පරණ හේනමැද කැබැල්ල" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන කේ. ඒ. රූපසිංහ යන අය විසින් සාදන ලද 2002 පෙබරවාරි 18 දාතම හා අංක 138/2002 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන්කොට ලොට් x වශයෙන් ලකුණු කොට ඇති ඉඩම කොටසට මායිම්, උතුරට: අංක 2798 දරන පිඹුරේ ලොට් 1 සහ 2, නැගෙනහිරට: පී. එෆ්. ඩී. විජේගුණවර්ධන සහ එච්. දාබරේ යන අයගේ ඉඩම සහ ෆැන්සිස් දාබරේ, යන අයගේ දේපල, දකුණට: අංක 6579 දරන පිඹුරේ ලොට් C සහ බස්නාහිරට: අංක 6579 දරන පිඹුරේ ලොට් 4 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන්, පර්චස් දහ තුනයි දශම එකයි බිංදුවක් (අ. 0, රූ. 0, පර්. 13.10) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, සහ එහි පිහිටි සෑම සියළු දේ සහ සියලුම මාර්ග අයිතින් ද, වෙනත් අයිතින් ද. වරප්‍රසාදයන් ප්‍රවශතාවයන්. පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබන්ධයන් ද සමග එකී අංක 138/2002 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව B 895/271 යටතේ කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

පහත සඳහන් දෑ දිගේ හා ඒ මතින් ගමන් කිරීමේ හා මාර්ග අයිතිය ද සමඟ ය.

කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්‍රිරුව B 620/312 සහ B 699/10 යටතේ පිළිවෙලින් ලියාපදිංචි කොට ඇති හා බලයලත් මානක තැන වී. එෆ්. ජේ. පෙරේරා යන අය විසින් සාදන ලද 1978 ජනවාරි 19 දාතම හා අංක 6579 දරන පිඹුරේ නිරූපිත ලොට් 4 සහ 5.

අධ්‍යක්‍ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

07-154

---

**ලංකා බැංකුව– කොල්ලුපිටිය අධිශ්‍රේණි I ශාඛාව**

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥා පනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ කරනු ලබන දැනුම්දීම

2013.04.04 වැනි දින පවත්වන ලද රැස්වීමක දී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

1. ප්‍රසිද්ධ නොතාරිස් ඩී. කිතුල්ගොඩ විසින් සහතික කරන ලද 2010.12.23 දිනැති අංක 2481 දරන උකස් බැඳුම්කරය මත මුල් මුදල හා 2013.02.11 දින තෙක් පොළිය වශයෙන් රුපියල් පනස් නව ලක්ෂ අනූ අට දහස් විස්සයි ශත පනස් හතක (රු. 5,998,020.57) මුදල සමඟ රුපියල් හතලිස් හත් ලක්ෂ හැත්තෑ නව දහස් නවසිය එකයි ශත හැට හයක (රු. 4,779,901.66) මුදල මත වසරකට සියයට විසි එකයි දශම පහක (රු. 21.05%) බැගින් පොලියක් 2013.02.12 වැනි දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් කොළඹ 03, කාර්විල් පෙදෙස, අංක 21හි සී/ස ඩැන් ඉංජිනියරින් සර්විසස් (පුද්) සමාගමේ මහත්වරුන්ගෙන් අයවිය යුතුව ඇත.

2. ප්‍රසිද්ධ නොතාරිස් ඩී. කිතුල්ගොඩ විසින් සහතික කරන ලද එකී අංක 2481 දරන 2010.12.23 දිනැති උකස් බැඳුම්කරය මත අයවිය යුතු එකී රුපියල් පනස් නව ලක්ෂ අනූ අට දහස් විස්සයි ශත පනස් හතක (රු. 5,998,020.57) මුදල සමඟ 2013.02.12 දින විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු පොලිය ද, ලංකා බැංකු ආඥාපනතේ 26 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද, අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත

විස්තර කොට ඇති දේපල ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොලොන්නාව, විහාර මාවත, අංක 50/3 හි පදිංචි වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතාටද, එකී ලංකා බැංකු ආඥා පනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වන වගන්තිය යටතේ ද, ලංකා බැංකු ආඥා පනතේ 21 වන වගන්තිය යටතේ මෙම යෝජනාවේ දැන්වීම පළ කිරීමට ලංකා බැංකුව, කොල්ලුපිටිය අධිශ්‍රේණි I ශාඛාවේ ප්‍රධාන කළමනාකරුටද මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරලේ, දාසිය පත්තුවේ, කටුනායක සීදූව නගර සභා සීමාව තුළ බණ්ඩාරවත්ත පිහිටි මීගමු පාරේ වරිපනම් අංක 200 දරන අඹගහවත්ත නමැති ඉඩමට එහි ඇති ගහකොළ ආදී සියලු දේ සමඟ බලයලත් මිනින්දෝරු කේ. ඊ. ජේ. බී. පෙරේරා විසින් සාදන ලද 1991 පෙබරවාරි 27 දිනැති අංක 2129 දරන පිඹුරෙහි ලොට් A ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් A උතුරට ජේ. එම්. ඒ. පෙරේරාට සහ ජී. එම්. සිල්වාට අයත් ඉඩමද, නැගෙනහිරට පී. එල්. ස්ටීවන් සිල්වාගේ සහ එස්. ඩී. පීටර් සිල්වාගේ උරුමකරුවන්ට අයත් ඉඩමද, දකුණට එකී පිඹුරෙහි මෙම ඉඩමෙහි ලොට් B ද, බස්නාහිරට අඩි 12 පළල පාර සහ ජේ. එම්. ඒ. පෙරේරාට සහ ජී. එම්. සිල්වාට අයිති ඉඩමද මායිම් ව එකී අංක 2129 දරන පිඹුරට අනුව පර්චස් විස්සක (අ. 0, රූ. 0, පර්. 20) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර මෙය මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ C 987/165හි ලියාපදිංචි කර ඇත.

මේ සමගම මෙයට එකී අංක 2129 දරන පිඹුරෙහි දක්වා ඇති පාරට වෙන් කළ කොටස මතින් සහ ඒ දිගට පාරේ අයිතියද ඇත.

ලංකා බැංකු අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

**එම්. එස්. සමරසිංහ මහත්මිය,**
ප්‍රධාන කළමනාකරු.

ලංකා බැංකුව,
කොල්ලුපිටිය අධි ශ්‍රේණි I ශාඛාව,
2013 මැයි මස 31 වැනි දින.

07-40

---

**කොමර්ෂල් බැංක් ඔෆ් සිලෝන් පී. එල්. සී.**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැංක් ඔෆ් සිලෝන් පී. එල්. සී හි (ලියාපදිංචි අංකය පී. කිව් 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබූ අභියෝජනාව

ණය ගිණුම් අංක : 545723.
ජෝර්ජ් කපිල නන්දන ලියනපතිරණ.
නානායක්කාරවසම් පුල්ලේ එදරලච්චිගේ ලක්මිනි ඩයස් ගුණවර්ධන.

2013 අප්‍රේල් මස 26 වන දින පවත්වන ලද රැස්වීමකදී කොමර්ෂල් බැංක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විශේෂයෙන් සහ ඒකඡන්දයෙන් මෙලෙස නිශ්චය කරන ලදී.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ජේ. ආර්. ගමගේ විසින් 2009 ඔක්තෝබර් 08 වන දින සහතික කරන ලද අංක 4027 දරන කොමර්ෂල් බැංක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි නමට ලියන ලද්දා වූ බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම ජෝර්ජ් කපිල නන්දන ලියනපතිරණ සහ නානායක්කාරවසම් පුල්ලේ එදරලච්චිගේ ලක්මිනි ඩයස් ගුණවර්ධන යන අය ණයකරුවන් ලෙස ද, ජෝර්ජ් කපිල නන්දන ලියනපතිරණ උකස්කරු ලෙසද පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් මිලියන හයක් සහ අටලක්ෂ තිස්අට දහස් එකසිය හැත්තෑ හයක (රු. 6,838,176) මුදලක් 2013 පෙබරවාරි 27 දින වන විට කොමර්ෂල් බැංක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රුපියල් මිලියන හයක් සහ අටලක්ෂ තිස්අට දහස් එකසිය හැත්තෑ හයක (රු. 6,838,176) මුදල අය කර ගැනීම සඳහා සහ 2013 පෙබරවාරි 28 වන දින සිට දේපල විකිණීමේ දිනය දක්වා කාලයට රුපියල් 5,653,804 ක මුදල මත 16% ක වැඩිදුර වාර්ෂික පොලිය සහිතව ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු ඇතුළුව මෙතෙක් ලබාගෙන ඇත්තා වූ යම් ගෙවීම් වෙතොත් ඒවාද අඩු කොට එකී අංක 4027 දරන බැඳුම්කරය මගින් කොමර්ෂල් බැංක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හට උකස් කොට ඇත්තා වූ ද මෙහි උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තා වූ ද දේපල සහ පරිශ්‍රය කොළඹ 12 හල්ෆ්ස්ඩොෆ් වීදියේ තෙවන මහලේ අංක 182හි ත්‍රිවංක සහ සේනානායක වෙන්දේසිකරුවෝ හි අනුඥාලත් වෙන්දේසිකරු එල්. බී. සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැංක් ඔෆ් සිලෝන් පී. එල්. සී. අධ්‍යක්ෂ මණ්ඩලය නිශ්චය කරනු ලබයි.

උපලේඛනය

බලයලත් මිනින්දෝරු ඩී. ඩබ්. අබේසිංහ විසින් 1990 සැප්තැම්බර් 15 වන දින සාදන ලද පිඹුරු අංක 3727හි දැක්වෙන බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ සල්පිටි කෝරලේ පල්ලේ පත්තුවේ මහරගම මහ නගර සභා සීමාවන් තුල උඩහමුල්ලේ වැටකේයාවල පාරේ පිහිටි ගොරකගහ කුඹුර හෙවත් වැටකේයාගහ කුඹුර නම් ඉඩමේ ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ එහි පවත්නා සියලු දේත් සමඟ බෙදා වෙන් කරන ලද ලොට් අංක 02 ලෙස සලකුණු කර ඇති බිම් කොටසට මායිම්:

උතුරට ලොට් අංක 01ද, නැගෙනහිරට පී. මාටින් පීරිස්ට අයත් ඕවිට ද, දකුණට වැටකේයාවල පාරද, බස්නාහිරට ලියනගේ හෙන්රි පෙරේරාට අයත් ඕවිට ද යන මායිම් තුළ, පෙර කී පිඹුරු අංක 3727ට අනුව පර්චස් දහඅටයි දශම අටයි පහක් (අ.0, රූ. 0, පර්. 18.85) හෝ හෙක්ටයාර 0.0477ක් විශාල ඉඩම දෙල්කඳ-නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ M 2265/273 වෙළුම/පත්‍රිරුව යටතේ ලියාපදිංචි කර ඇත.

තවද, මෑතකදී කරන ලද මිණුම්ගත කිරීමකට අනුව ඉහත කී ඉඩම මෙසේ විස්තර කර ඇත.

බලයලත් මිනින්දෝරු එම්. ඒ. ජයරත්න විසින් 2004 ඔක්තෝබර් 30 වන දින සාදන ලද පිඹුරු අංක 5020හි ලොට් අංක 02 (මෙය බලයලත් මිනින්දෝරු ඩී. ඩබ්. අබේසිංහ විසින් 1990 සැප්තැම්බර් 15 වන දින සාදන ලද පිඹුරු අංක 3727හි දැක්වෙන ලොට් අංක 02හි නැවත මිණුම් ගත කිරීමකි) ලෙස සලකුණු කර ඇති ඉහත කී උඩහමුල්ලේ පිහිටි ගොරකගහ කුඹුර හෙවත් වැටකේයාගහ කුඹුර නම් ඉඩමේ ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ එහි පවත්නා සියලු දේත්, සමග බෙදා වෙන් කරන ලද ලොට් 2 ලෙස සළකුණු කර ඇති බිම් කොටසට මායිම්:

උතුරට ලොට් අංක 01 ද, නැගෙනහිරට පී. මාටින් පීරිස්ට අයත් ඕවිට ද, දකුණට වැටකේයාවල පාරද, බස්නාහිරට ලියනගේ හෙන්රි පෙරේරාට

අයත් ඕවිට ද යන මායිම් තුල පෙර කී පිඹුරු අංක 5020ට අනුව පර්චස් දහඅටයි දශම අටයි පහක් (අ.0, රූ. 0, පර්. 18.85) හෝ හෙක්ටයාර් 0.0477ක් විශාල ඉඩම.

**ආර්. ආර්. දුනුවිල මිය,**
සමාගම් ලේකම්.

07-112

---

**සෙලාන් බැංකුව පීඑල්සී– සංස්ථා බැංකු ව්‍යාපාර ඒකකය**

(2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිවු 9 යටතේ ලියාපදිංචි කර ඇත)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

ගිණුම් අංක : 0864-040483-001.

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් 2013.02.22 වැනි දින පවත්වන්නට යෙදුනු රැස්වීමේ දී 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පීකිව් යටතේ ලියාපදිංචි කර ඇත) ප්‍රසිද්ධ නොතාරිස් ටී. එච්. ඩී. එල්. ජයසේකර විසින් දෙකම සහතික කරන ලද 2002 ජනවාරි 17 අංක 607 සහ 2003 ඔක්තෝබර් 8 දිනැති අංක 852 දරන බැඳුම්කර මත අයවිය යුතු මුදල් ගෙවීම, කොළඹ 04හි ලියාපදිංචි අංක එන් (පීවීඑස්) 1347 දරන 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ සහ යථා පරිදි සංස්ථාපිත සමාගමක් වන ඉන්ස්ටිටියුට් ඔෆ් ඩේටා මැනේජ්මන්ට් (ප්‍රයිවෙට්) ලිමිටඩ් යන අය බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් එක්කෝටි විසිහතර ලක්ෂ අසූතුන්දහස් පන්සිය දෙකයි ශත එකක (රු. 1,24,83,502.01) මුදලක්, 2012 ජූලි 29 වැනි දින වන විට සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රු. 1,24,83,502.01 මුදල ද, 2012 ජූලි 30 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට විසි නවය (29%) බැගින් වූ පොලිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තු ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 607 සහ 852 දරන බැඳුම්කර මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස් කර ඇත්තාවූ මෙහි පහත සඳහන් 1 වැනි සහ 2 වැනි උපලේඛනවල සවිස්තරව විස්තර කර ඇති දේපල සහ පරිශ්‍රයන් බලයලත් වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පී.එල්.සී. අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

**පළමු වැනි උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, බම්බලපිටිය පිහිටි කොළඹ මහ නගර සභා සීමාව තුළ මිලාගිරිය කොට්ඨාසයේ, ගවර් වීදිය වරිපනම් අංක 38/2 සහ ඩේසිවිලා ඇවනියු 25 (කොටසක්) දරන බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. පී. පී. ඩී. ඩී. ජයවර්ධන විසින් සාදන ලද 1989.02.23 දිනැති අංක 576බී සැලැස්මේ නිරූපනය වන ලොට් 1 ලකුණු කල බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම් උතුරට: වරිපනම් අංක 38/2 සහ 38/2ඒ, ගවර් වීදියේ කොටසක් දරන පරිශ්‍රයන් ද, නැගෙනහිරට: වරිපනම් අංක 25 දරන පරිශ්‍රය, ඩේසිවිලා ඇවනියු ද, දකුණට: ඩේසිවිලා ඇවනියු සහ බස්නාහිරට: ඩුප්ලිකේෂන් පාර ද යන මායිම් තුළ එකී අංක 576බී දරන සැලැස්ම අනුව පර්චස් හයයි දශම හතරයි අටක් (අ. 0, රූ. 0, පර්. 6.48) ක් විශාල, ගොඩනැගිලි සහ එහි පිහිටි සියලු දේ සමග ඉඩම. මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්‍රිුරුව ඒ 975/6, ඒ 978/134හි ලියාපදිංචි කර ඇත.

එකී ලොට් 1, දෙකම බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. පී. පී. ඩී. ඩී. ජයවර්ධන විසින් සාදන ලද 1989.02.23 දිනැති අංක 576 දරන සැලැස්මේ නිරූපනය වන ලොට් 1 හි සහ 1989.02.23 දිනැති අංක 576ඒ දරන සැලැස්මේ නිරූපනය වන ලොට් බී1හි එකතුවත් වන අතර පහත සඳහන් පරිදි විස්තර කර ඇත.

පෙර කී පරිදි කොළඹ මහ නගර සභා සීමාව තුළ මිලාගිරිය කොට්ඨාසයේ ඩේසිවිලා ඇවනියු හි වරිපනම් අංක 25 (කොටසක්) දරන ලොට් 1 ලකුණු කල බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම් උතුරට: වරිපනම් අංක 38/2 සහ 38/2ඒ, (කොටසක්) ගවර් වීදිය දරන පරිශ්‍රයන් සහ එකී අංක 576 දරන සැලැස්මේ ලොට් බී1 ද යන මායිම් තුළ පර්චස් පහයි දශම හතයි අටයි තුනක් (අ. 0, රූ. 0, පර්. 5.783)ක් විශාල ඉඩම; සහ

පෙර කී පරිදි පිහිටි කොළඹ මහ නගර සභා සීමාව තුළ මිලාගිරිය කොට්ඨාසයේ ඩේසිවිලා ඇවනියු හි වරිපනම් අංක 38/2 (කොටසක්) දරන ලොට් බී1 ලකුණු කල බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම් උතුරට: වරිපනම් අංක 38/2 සහ 38/2ඒ, (කොටසක්) ගවර් වීදිය දරන පරිශ්‍රයන් ද, නැගෙනහිරට: පෙරකී අංක 576 දරන සැලැස්මේ ලොට් 1 සහ, බස්නාහිරට: ඩුප්ලිකේෂන් පාර ද, යන මායිම් තුළ පර්චස් දශම හයයි අටයි නවයක් (පර්. 689) ක් විශාල ඉඩම.

**දෙවැනි උපලේඛනය**

1. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරලේ පල්ලේ පත්තුවේ, කොළඹ මහනගර සභා පරිපාලන සීමාව තුළ වෝඩ් අංක 39 මිලාගිරිය බම්බලපිටිය ඩේසිවිලා ඇවනියු දිගේ පිහිටි දැන් ඩේසිවිලා ඇවනියු වරිපනම් අංක 25 දරන (මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ රජයේ මිනින්දෝරු අයි. අයි. ජේ. රූපසිංහ විසින් සාදන ලද 1981 ජූනි 28 දිනැති අංක 68/සීඑච්/13/3549/පී. එස්. 53 දරන මිනුම් සැලැස්මේ ලොට් 1 ලෙස ද නිරූපනය වන එකී ඉඩම් කොටසට බලයලත් මිනින්දෝරු එස්. රාජේන්ද්‍ර විසින් සාදන ලද 1963 මාර්තු 20 දිනැති අංක 2584 දරන මිනුම් සැලැස්මේ ලොට් ඒ ලෙස නිරූපනය වන බෙදා වෙන් කරන ලද නැගෙනහිර කොටසින් නැවත මැනීමක් සහ අතුරු බෙදීමක් වන) බලයලත් මිනින්දෝරු කේ. සෙල්වරත්නම් විසින් සාදන ලද 2000 දෙසැම්බර් 01 දිනැති අංක 9259 දරන සැලැස්මේ ලොට් ඒ 1 ලකුණු කල ඉඩම් කොටසට මායිම් උතුරට: ගවර් වීදිය වරිපනම් අංක 38/2 දරන පරිශ්‍රය ද, නැගෙනහිරට: ලොට් බී2 ඩේසිවිලා ඇවනියු වරිපනම් අංක 27 පරිශ්‍රය සහ අංක 2584 දරන සැලැස්මේ සඳහන් ලොට් බී1 (වීථි රේඛා නියමයන් ඇතුලත වූ ඉඩම), දකුණට: ලොට් ඒ2 (වීථි රේඛා නියමයන් ඇතුලත වූ ඉඩම) සහ බස්නාහිරට: ඩේසිවිලා ඇවනියු දැන් වරිපනම් අංක 23 දරන අංක 2584 දරන සැලැස්මේ සඳහන් ලොට් ඒ හි කොටසක් යන මායිම් තුළ පෙරකී අංක 9259 දරන සැලැස්ම අනුව පර්චස් අටයි දශම හතයි පහක් (අ. 0, රූ. 0, පර්. 08.75) හෙක්ටයාර් 0.02213 (වර්ග මීටර් 221.3) ක් විශාල ඉඩම. මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්‍රිුරුව ඒ 1019/102හි ලියාපදිංචි කර ඇත.

2. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරලේ පල්ලේ පත්තුවේ, කොළඹ මහනගර සභා පරිපාලන සීමාව තුළ වෝඩ් අංක 39

මිලාගිරිය බම්බලපිටිය ඩේසිවිලා ඇවනියු දිගේ පිහිටි දැන් ඩේසිවිලා ඇවනියු වරිපනම් අංක 25 දරන (මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ රජයේ මිනින්දෝරු එච්. ජේ. රූපසිංහ විසින් සාදන ලද 1981 ජුනි 28 දිනැති අංක 68/සීඑච්/13/3549/පී. එස්. 53 දරන මිනුම් සැලැස්මේ ලොට් 2 ලෙස ද නිරූපනය වන එකී ඉඩම් කොටසට බලයලත් මිනින්දෝරු එස්. රාජේන්ද්‍ර විසින් සාදන ලද 1963 මාර්තු 20 දිනැති අංක 2584 දරන මිනුම් සැලැස්මේ ලොට් ඒ ලෙස නිරූපනය වන බෙදා වෙන් කරන ලද නැගෙනහිර කොටසින් නැවත මැනීමක් සහ අතුරු බෙදීමක් වන) බලයලත් මිනින්දෝරු කේ. සෙල්වරත්නම් විසින් සාදන ලද 2000 දෙසැම්බර් 01 දිනැති අංක 9259 දරන සැලැස්මේ ලොට් ඒ 2 (වීථි රේඛා නියමයන් තුළ ඉඩම) මායිම් උතුරට: අංක 9259 සැලැස්මේ සඳහන් ලොට් ඒ1 ද, නැගෙනහිරට: අංක 2584 දරන සැලැස්මේ සඳහන් ලොට් බී1 (වීථි රේඛා නියමයන් තුළ ඉඩම), දකුණට: ඩේසිවිලා ඇවනියු සහ බස්නාහිරට: ඩේසිවිලා ඇවනියු දැන් වරිපනම් අංක 23 දරන අංක 2584 දරන සැලැස්මේ සඳහන් ලොට් ඒ හි කොටසක් යන මායිම් තුළ පෙරකී අංක 9259 දරන සැලැස්ම අනුව පර්චස් දශම හතයි බිංදුවක් (අ. 0, රූ. 0, පර්. 0.70) හෙක්ටයාර් 0.00177 (වර්ග මීටර් 17.7) ක් විශාල ඉඩම. මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්‍රිරුව ඒ 1019/103හි ලියාපදිංචි කර ඇත.

එකී ඉඩම් කොටස පහත සඳහන් ඉඩම් කොටසෙන් බෙදා වෙන් කරන ලද එකකි.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ සහ මහ නගර සභාව තුළ මිලාගිරිය කොට්ඨාශයේ ඩේසිවිලා ඇවනියු දැන් වරිපනම් අංක 25 දරන බලයලත් මිනින්දෝරු එස්. රාජේන්ද්‍ර විසින් සාදන ලද 1963 මාර්තු 20 දිනැති අංක 2584 දරන සැලැස්මේ සඳහන් ලොට් ඒ ලකුණු කල ගොඩනැගිලි සහ එහි පිහිටි වගා සමග ඉඩම් කොටසට මායිම් උතුරට: ගවර් වීදිය දැන් වරිපනම් 38/2 දරන පරිශ්‍රය ද, නැගෙනහිරට: අංක 2584 දරන සැලැස්මේ නිරූපනය වන මෙම ඉඩමේ ලොට් බී (දැන් වරිපනම් අංක 27 (කොටසක්) ඩේසිවිලා ඇවනියු), දකුණට: ඩේසිවිලා ඇවනියු සහ බස්නාහිරට: දැන් වරිපනම් අංක 19 දරන පරිශ්‍රය ඩේසිවිලා ඇවනියු යන මායිම් තුළ පෙර කී අංක 2584 දරන සැලැස්ම අනුව පර්චස් විස්සයි දශම දෙකයි හතක් (අ. 0, රූ. 0, පර්. 20.27) ක් විශාල ඉඩම. මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්‍රිරුව ඒ 751/168 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්‍ෂ මණ්ඩලයේ අණ පරිදි,

වී. ඒ. පරණගම මිය,
ප්‍රධාන කළමනාකාරිණී-නීති.

07-106

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන
## සංශෝධිත ගාස්තු

2013 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ.)

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය. මුදල් ඇණවුම් ගෙවන කාර්යාලය බොරැල්ල තැපැල් කාර්යාලය වේ.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යැයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2013 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | *රු. ශ.* |
|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 00 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 00 |
| තනි තීරුවකට හෝ *ගැසට් පිටුවකින්* අඩකට ... ... ... | 1,300 00 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ *ගැසට් පිටුවකට* ... ... ... | 2,600 00 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ *ගැසට් පත්‍රයේ* සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. *ගැසට් පත්‍රය* නොලැබීම, ප්‍රමාද වී ලැබීම සහ ලිපිනය වෙනස් කිරීම් ආදිය කොළඹ 08, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, මුද්‍රණාලයාධිපතිට දැනුම් දිය යුතු ය.
14. **2013 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | *වාර්ෂික දායක මුදල* *රු. ශ.* | *තැපැල් ගාස්තුව* *රු. ශ.* |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 4,160 00 | 9,340 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 580 00 | 950 00 |
| III වැනි ඡේදය (වෙළඳ ලකුණු හා පේටන්ට් බලපත්‍ර ආදිය ) ... ... | 405 00 | 750 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව ) ... ... | 890 00 | 2,500 00 |
| II වැනි කොටස (අධිකරණ) ... ... ... ... ... ... ... ... | 860 00 | 450 00 |
| III වැනි කොටස (ඉඩම්) ... ... ... ... ... ... ... ... | 260 00 | 275 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... | 2,080 00 | 4,360 00 |
| V වැනි කොටස (මගීන් ගෙන යෑමේ අවසර සහ පොත් නාමාවලිය) | 1,300 00 | 3,640 00 |
| VI වැනි කොටස (ජූරිසභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාම ලේඛනය) ... ... | 780 00 | 1,250 00 |
| අති විශෙෂ *ගැසට් පත්‍රය*... ... ... ... ... ... ... ... | 5,145 00 | 5,520 00 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

### * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | පිටපතක මිල *රු. ශ.* | තැපැල් ගාස්තුව *රු. ශ.* |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 00 | 60 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 00 | 60 00 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 00 | 60 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 00 | 120 00 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 00 | 60 00 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 00 | 60 00 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 00 | 60 00 |

* කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ, අංක 163 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් තනි පිටපත් මිල දී ගත හැක.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති *උපලේඛනයේ* දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙනන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

***සැළකිය යුතුයි.*** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2013** | | | |
| ජූලි | 2013.07.05 | සිකුරාදා | 2013.06.21 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2013.07.12 | සිකුරාදා | 2013.06.28 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2013.07.19 | සිකුරාදා | 2013.07.05 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2013.07.26 | සිකුරාදා | 2013.07.12 | සිකුරාදා | දහවල් | 12.00 |
| අගෝස්තු | 2013.08.02 | සිකුරාදා | 2013.07.19 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2013.08.08 | බ්‍රහස්පතින්දා | 2013.07.26 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2013.08.16 | සිකුරාදා | 2013.08.02 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2013.08.23 | සිකුරාදා | 2013.08.08 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2013.08.30 | සිකුරාදා | 2013.08.16 | සිකුරාදා | දහවල් | 12.00 |
| සැප්තැම්බර් | 2013.09.06 | සිකුරාදා | 2013.08.23 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2013.09.13 | සිකුරාදා | 2013.08.30 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2013.09.20 | සිකුරාදා | 2013.09.06 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2013.09.27 | සිකුරාදා | 2013.09.13 | සිකුරාදා | දහවල් | 12.00 |

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ. බ.)*

2013 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.